ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

03 ගුණගරුක ළමා පරපුරක් ගොඩනැඟීමට නම්


08 සභාව නම් දේව ජනතාවමයි


12 සුදු වැල්ලක සිට රතු පස් දෙස බැලීම



# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජූනි 07

www.colombocatholicpress.com


ශ්‍රී ලාංකික කතෝලික ගුවන් විදුලි විකාශය "සියැලි හඬ" ශ්‍රවණය කිරීම සඳහා පිවිසෙන්න www.lankacatholic.com

සියැලි හඬ Radio

වැඩි විස්තර සඳහා අමතන්න 077 1577779

ක්‍රි.ව. 2013 ක් වූ සැප්තැම්බර් 22 ඉරිදා 148 වෙළුම 17 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/51/NEWS/2013

## කතෝලික සමාජ දර්ශනය අනුව දේශපාලනය දයාව දැක්වීමේ ඉහළම ගුණාංගයයි

# කතෝලිකයාට දේශපාලනයට සෘජුව සම්බන්ධවීමේ ණය යුක්තියක් තිබෙනවා

## අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ගිහි, පැවිදි, පූජක සැමට අවධාරණය කර සිටී.

**යහපත් කතෝලිකයෙක් දේශපාලනයට සෘජුව සම්බන්ධ වන්නේ නැති බවට මතයක් පවතී. එහෙත් එය සත්‍යයක් නොවේ. එය නිවැරදි මාවත ද නොවේ. යහපත් කතෝලිකයෙක් දේශපාලනයට ඇඟිලි ගසමින් තමන්ගෙන් ලබා දිය හැකි උපරිම දායකත්වය කැපවීමෙන් ලබා දිය යුතුයි. කතෝලිකයාට දේශපාලනයෙන් වෙනස් මඟක් ගත නොහැකි නිසා සිය යෝජනා මඟින් හා නිරන්තර යාච්ඤාවෙන් ඊට සම්මාදම් වීමට යුතුකමක් හා වගකීමක් තිබෙන්නේ යැයි අති උත්තම ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ඉකුත් සඳුදා පෙරවරුවේ සාන්ත මාර්තාහි පැවති දේව මෙහෙයේදී පැවසීය.**

15 පිටුවට

## අතිගරු සිරිල් පෙරේරා පියතුමා ස්වර්ගස්ථ වේ



කොළඹ අගරදගුරු පදවි හා ජාතික ධර්මෝපදේශ අධ්‍යක්ෂව සිටි අතිගරු සිරිල් පෙරේරා පියතුමා පසුගිය ඉරිදා ස්වර්ගස්ථ විය.

1970 දී පූජකවරය ලත් මෙතුමා කඳාන මීසම් පුතකු වන අතර වැලිවිට, කටුකුරුන්ද හා වැල්ලවත්ත මීසම්හි දීර්ඝ මීසම් සේවාවකින් පසුව පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂක ලෙස හා පසුව ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ වශයෙන් වසර ගණනාවක් සේවය කළේය. මෙතුමන්ගේ අධ්‍යක්ෂ ධුරය දැරූ සමය ධර්මෝපදේශ අධ්‍යාපනයේ විශාල පරිවර්තනයක් සිදු වූ බව තතු දත් අය පවසති.

15 පිටුවට

## අපෝස්තලික තානාපති තුමන් දැනුම්වත් කැරේ

ශ්‍රී ලංකාවේ අපෝස්තලික තානාපති අති උතුම් ජෝශප් ස්පිටෙරි අගරදගුරු හිමිපාණන් හට උතුරු නැගෙනහිර ප්‍රදේශවල සිදුකරන සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ දැනුම්වත් කිරීමේ සංදේශයක් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය සරත් කුමාර ගුණරත්න මහතා විසින් භාර දෙන ලදී.

එහිදී මේ වන විටත් මන්නාරම ඇතුළු උතුරු ප්‍රදේශයේ සිදුකරන සංවර්ධන ක්‍රියාවලියන් පිළිබඳව දැනුම්වත් කිරීම එහි ප්‍රධාන අරමුණ විය.



## කන්‍යා මාතාවන්ට පරිභව කරන අන්තවාදී රැල්ලක්

### ඔවුන් වෙනුවෙන් සංසුන්ව මෛත්‍රිය වඩන මෙන් කතෝලික ගිහි සංවිධාන ඉල්ලීමක් කරති

මීට දශක ගණනාවකට පෙර "කන්නි මරියාගේ හැටි" නමින් ආ අන්තවාදි රැල්ල නැවතත් පණ ගැන්වෙමින් අන්තර්ජාලය හරහා තම නිරුවත පෙන්වන බව දසතින් වාර්තා වේ. දරා සිටින චීවරය පවා හැල්ලු කරමින් තේවත්ත බැසිලිකාව විනාශ කරන බවට මුසා බස් දොඩමින් මේ අන්තවාදී නඩය නටන නැටිලි හමුවේ ඔවුන් වෙනුවෙන් යාච්ඤා කරන මෙන් කතෝලික ගිහි නායකයෝ සියලු සැදැහැවතුන්ගෙන් ඉල්ලීමක් කරති.

15 පිටුවට

## කරත්ත මංගල්ලේ අද ගුවනින්

කට්ටිමහන සා. ආනා සිද්ධස්ථානයේ වාර්ෂික කරත්ත මංගල්‍යයේ දිව්‍ය පූජාව සැප්. 22 ඉරිදා පෙ.ව. 11.00 සිට ප.ව. 12.30 දක්වා ශ්‍රී ලංකා ගුවන් විදුලියේ ස්වදේශීය සේවය ඔස්සේ විකාශනය වේ.

**(✍ ජූඩ් අයිවන්)**

## දළුගම ඇස් කණ්නාඩි බෙදාදීමක්

දළුගම ශු. ප්‍රැන්සිස් සාලෙස් මුනිඳුන්ගේ දේවස්ථානයේ 2013 සැප්තැම්බර් 22 වන ඉරුදින උදේ 9.00 සිට ඇස් කණ්නාඩි 500 ක් ප්‍රදේශවාසී ජනතාව අතර නොමිලේ බෙදා දෙනු ලැබේ. **(ගරු ජූඩ් ශාමන් පියතුමා)**

## කාදිනල් කුරේ සමරුවට විශේෂ මුල් දින කවරයක්

දේව සේවක තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් සගසුව දිනීමේ විසිපස්වන සංවත්සරය නිමිත්තෙන් විශේෂ අනුස්මරණ මුල් දින කවරයක් නිකුත් කිරීමට තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශයේ මඟ පෙන්වීම මත මුද්දර කාර්යාංශය කටයුතු යොදා තිබේ.

කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් කරන ලද ඉල්ලීමක් මත මේ සඳහා විධි විධාන යොදා තිබේ.

# කතෝලිකයන් මුලාකරන මේ මූලධර්මවාදී ඊනියා සුභාරංචි මාලාවට විරෝධය දක්වන්න

## 'කිතුහඬ' කතෝලික දහම රැක ගැනීමේ ජාතික ව්‍යාපාරය ජා ඇල ජනතාවගෙන් ඉල්ලා සිටී

ජා ඇල සෙක්කුවත්ත ක්‍රීඩාංගනයේ (පොලීසිය පිටුපස) ලබන 25 වෙනිදා සිට 29 වෙනිදා දක්වා සවස 5 සිට මධ්‍යම රාත්‍රිය දක්වා දින පහක් පැවැත්වීමට සංවිධානය කර ඇති ඉවැන්ජලිස්ත මූලධර්මවාදීන්ගේ මහා යාච්ඤා මෙහෙයන් මාලාවට එරෙහිවන මෙන් ජා ඇල මීසම්වාසී ජනතාවගෙන් හා තුඩැල්ල දිසා ජනතාවගෙන් 'කිතුහඬ' කතෝලික දහම රැක ගැනීමේ ජාතික ව්‍යාපාරය ඉල්ලා සිටී.

ජා ඇල ප්‍රදේශයේ ගෙයින් ගෙට යමින් කතෝලිකයින් මූලධර්මවාදීන්ගේ දහමට හරවා ගැනීමේ හා සුබාරංචිය දේශනා කරමින් ජනතාවට ආධාර දෙමින්, මරිය බැතියට හා සාන්තුවර බැතියට අපහාස කර ජනතාව මුලා කරමින්, කතෝලිකයින් විශාල ප්‍රමාණයක් තම සංවිධානයට හරවා ගැනීමේ වැඩ සටහන් මාලාවක්ද මෙම මහා සුභාරංචි යාච්ඤා මෙහෙයට සමගාමීව ජා ඇල ප්‍රදේශයේ සිදු කිරීමට මොවුන් කටයුතු කරමින් යන බව තතුදත් ආරංචි මාර්ග පවසයි.

15 පිටුවට

## "දෙවියන් වහන්සේටත්, වස්තුවටත් සේවය කරන්නට ඔබට බැරිය." (ලූක් 16:1-13)

පදවියට

# විශ්වාසය විශ්වාස කරන්න


## ගාල්ල රදගුරු හිමිපාණෝ මාතරදී පවසති

**විශ්වාසය විශ්වාස කරන්න. දෙවියන් වහන්සේ තුළ ආයුධයක් වන්න. එතැනින් පටන් ගන්න. අනිකුත් අයමෙන් භය භක්තියෙන් හැදී වැඩුනු මරිය තුමිය දෙවියන් වහන්සේගේ කරුණාව නිසා තමන්ව තෝරා ගත් බව මුල සිටම විශ්වාස කළා.**



මාතර අප ස්වාමිදුවගේ දෙව් මැඳුරේ 106 වැනි වාර්ෂික මංගල්‍යය මහා පූජාව අවස්ථාවේදී ගාලු රදගුරු අතිඋතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණෝ එසේ ප්‍රකාශ කළහ. මෙවර මංගල්‍යය අති උත්කර්ෂවත් අන්දමින් සංවිධානය කරමින් ඉමහත් වෙහෙසක් දැරූ සිද්ධස්ථාන පරිපාලක ගරු ඩේමියන් අර්සකුලරත්න පියතුමන් තේමාව කර ගත්තේ මරිය රැජිණියේ මා දයාබර මවේ දුබල අපට සැමදා සරණ වන මවේ" යන්නිය.

## සුබාසිංසන




අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්ගේ උපන්දිනය සැප්තැම්බර් 27 දාට යෙදේ. එතුමනට සමිඳු ආසිරි බහුලව ලැබේවායි! ප්‍රදීපයෙන් සුබ පැතුම්!



මෙරට සුසාන භූමියක පිහිටි එකම කතෝලික සිද්ධස්ථානය වන මාරවිල ශ්‍රී කුරුස ජාතික සිද්ධස්ථානය බැහැදැකීමට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පැමිණි අතර සිද්ධස්ථාන පාලක ගරු අයිවන් පීටර් ප්‍රනාන්දු හා සහායක ගරු දිනේෂ් සෝවිස් යන පියවරුන්ද සැදැහැවතුන්ද විසින් ජනාධිපතිතුමා මහත් හරසරින් පිළිගන්නා ලදී. එම අවස්ථාව සැමරීමේ තිළිණයක් ගරු පියතුමන් විසින් පිරිනමනු ලැබීය. සිද්ධස්ථානයේ වසර 88 ක ඉතිහාසයේ මෙරට රාජ්‍ය නායකයකු මෙහි පැමිණි ප්‍රථම අවස්ථාව මෙයයි.



ගාල්ල රදගුරු පදවියේ භාග්‍යවත් ජුසේවාස් දේව ධර්ම නිකේතනය නිකුත් කළ රුහුණු සංජීවධාරා සඟරාවේ මංගල කලාපය පසුගියදා බැල්කම් පෙදෙසේ රදගුරු සමුලු ශාලාවේ පැවති ජුසේවාස් ජාතික කාර්යාංශ රැස්වීමේදී එහි සභාපති අතිඋතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණන්ට ගාලුපදවි ජුසේවාස් කමිටු උපාධ්‍ය ගරු බීඩ් සිල්වා පියතුමා පිළිගැන්වූ අයුරු. ජාතික ලේකම් ගරු ආචාර්ය ඇන්ටනි ප්‍රනාන්දුපුල්ලේ පියතුමා පසෙක සිටී.



හංවැල්ල මීසමේ සියලු සභාවන් එකමුතුව නිරිපොල දේවස්ථානයේ සිට ජපමාල අභිරහස් භාවනා කරමින් ජපමාල පෙරහරකින් පහත්ගම දේවස්ථානයට පැමිණි මීසමේ සැදැහැවතුන් මීසම් සහයක ගරු රෝෂාන් චමින්ද පියතුමා සමගින් ගුරුබැවිල දිසානායක හංවැල්ල මීසම් සේවක ගරු ගියොම් නෝනිස් පියතුමාගේ ප්‍රධානත්වයෙන් දේව මාතා උත්පත්ති මංගල්‍යය පසුගියදා සැමරූහ.

ඇන්තනි හෙට්ටිආරච්චි

පියෝ චන්ද්‍රසිරි

## විල්ලෝරාවත්ත දිව්‍ය සත්ප්‍රසාද මංගල උලෙළ

විල්ලෝරාවත්ත මීසමේ වාර්ෂික දිව්‍ය සත්ප්‍රසාද මංගලෝත්සවය පිළියන්දල වෑවල ශුද්ධවූ ලාසරස් මුනි දේවස්ථානයේදී පැවැත්විණ.

විශේෂ සූදානම් වීමේ මෙහෙයන් වලදී සැදැහැවත් ජනතාවගේ ගෞරවය දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට යොමුවන පිණිස දිව්‍ය සත්ප්‍රසාද වහන්සේගේ විශේෂ ප්‍රාතිහාර්යය ඇතුළත් චිත්‍රපටයක් ප්‍රදර්ශනය කැරිණ. මීසමට අයත් වෑවල, දම්පෙ සහ විල්ලෝරාවත්ත යන සැදැහැවත් ජනතාවගේ සහභාගිත්වයෙන් දිව්‍යසත්ප්‍රසාද මංගල්‍යය මහත් හරසරින් පැවැත්විය.

දේව මෙහෙය ගරු එමාඩ් දල්පදාදු නි.ම.නි පියතුමාගේ ප්‍රධානත්වයෙන්ද මීසම් සේවක ගරු ටෝනි පින්ටෝ සහ සහයක ගරු ප්‍රසන්න ප්‍රනාන්දු පියතුමන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විණ. වෑවල දේවස්ථානයේ සිට සුබෝධි ආයතනය දක්වා ජනතාව සුදුවතින් පෙරහරේ ගමන් ගත් අතර සුබෝධි ආයතනයේදී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේගේ විශේෂ ආශිර්වාදයෙන් අවසන් විය.

ෂාමිණී දම්පේ




කන්ජුක්කුලිය මීසමට අයත් උඩයන්දළුව කුඩාමඩු දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය වෙනුවෙන් දේවස්ථානය අබිමුව ඉදිවූ අලංකාර තොරන සහ මණ්ඩප සැරසිලි මෙහි වේ. තොරණ සාදා ඇත්තේ දේවස්ථානයේ (ඉදිරිපස) ආකෘතියකට අනුවය. ඒ සඳහා අමුද්‍රව්‍ය ලෙස යොදාගෙන ඇත්තේ විශේෂිත වූ සුදු කොහු ආශ්‍රයෙන් සාදන ලද ලණු සහ දුඹුරු පැහැ කොහු ලණුය. ඩැපොග් යොදා ගනිමින් එහි අලංකාරය තවත් වැඩිකර ඇති අතර මණ්ඩප සැරසිලි සහ තොරණ එකම තේමාවකට සකස් කර තිබීම මෙහි වූ විශේෂත්වයක් විය.


## දෙව්මව් දිවියේ ඇරියුම විශ්වාසයේ දිවි ගමනකටයි

දෙවිඳුන් වෙත නොසැලෙන අන්දමේ විශ්වාසයකින් පසුවී අවසානයේ ස්වර්ගීය ඔටුනු පළන් දෙව් මව්ගේ ජීවිතය අපහට විශ්වාසයෙන් පිරි දිවි ගමනකට කරන ආරාධනයකැයි නායකකන්ද මීසම් සහයක ගරු චානක ප්‍රසාද් පියතුමා උස්වැටකෙයියාව සා. මරියා දෙව්මැඳුරේ වාර්ෂික මංගල මෙහෙයයේදී පැවසීය.

වැලිවේරිය මීසම් සහයක ගරු ලලිත් ක්‍රිෂාන්ත පියතුමන් විසින් පවත්වන ලද මෙම මංගල පූජා යාගයට ගල්කිස්ස මීසම් සහයකව සිටි ගරු ප්‍රියාන් සුභාෂණ පියතුමා හවුල්විය.

මීසම් සේවක ගරු අයිවන් පීටර්ස් පියතුමාගේ සහ ධර්මසේවා සභාවේ කැපවීමත් මීසම් වාසින්ගේ සහයත් මත සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වූ මෙම වාර්ෂික මංගල්‍යය පැවතියේ 'දෙව්මව් සමගින් විශ්වාසයීය දිවියකට' යන තේමාව යටතේය.

පස්කල් ජයමාන්න



එදා සුනාමියේදී සුනාමි රළ පහර පමුණුගම ඇලෙන්එගොඩ ප්‍රදේශයේ මුහුදු කන්දට උඩින් පැමිණ නැවතුන ස්ථානයේ ප්‍රදේශය ආරක්ෂා කළ පමුණුගම මීසමේ රාක්ෂාධිකාර ශුද්ධවූ ජුසේ මුනිඳුන්ට උපහාරයක් ලෙස ප්‍රදේශවාසින් ගොඩනැගූ සිහිවටන මණ්ඩපයේදී දිව්‍ය යාගයක් පමුණුගම පූජක පුතකු රත්නපුර මරිය හමුදා උපාධ්‍ය හා කෑගල්ල මීසම් සහයක ගරු ශ්‍රේෂන් හපුආරච්චි පියතුමා පැවැත්විය. පමුණුගම මීසම් සහයක ගරු රසික ලෝරන්ස් ප්‍රනාන්දු පියතුමා ද සිටී.

සටහන - ජෝ. සංගපාලආරච්චි

සේයා - උපාලි කරුණානායක



කුඩා පයාගල පරලෝකරාජේ ශ්වරියගේ දෙව්මැඳුරේ 138 වන වාර්ෂික මංගල්‍යය මීසම් සේවක ගරු සිසිර සමරකෝන් පියතුමාගේ මඟපෙන්වීම මත පැවැත්විණ. ප්‍රතිමාව රැගත් පෙරහර ගමවටා සංචාරය කළ අයුරු.

ජී. නිහාල් ප්‍රනාන්දු

## කොටරුපේ මංගල උලෙළ


අන් අයගේ කුසගින්න දුක් වේදනා අපට දැනෙන්න අවශ්‍යයි. එසේ නොවනුයේ නම් අප මෙලෝ රහක් නැති, වැඩකට නැති කිතුනුවන් වෙනවා යැයි වත්තල සා. අන්තෝනි විදුහලේ ආචාර්ය මණ්ඩලයේ ගරු කෘෂන් කුමාර් පෙරේරා පියතුමා කොටරුපේ සා. ලුවිස් මුනි දෙව් මැඳුරේ 109 වන වාර්ෂික මංගල දිව්‍ය පූජාවේදී පැවසීය.

ප්‍රැන්සිස්කන් තෙවන නිකායේ ප්‍රාදේශියාධිපති අතිගරු මාක් ප්‍රනාන්දු පියතුමා නුවාන දිනවල දේශන පැවැත්විය. මහවීදිය මීසම් සේවක ගරු ශ්‍රියානන්ද ප්‍රනාන්දු පියතුමා සන්ධ්‍යා මෙහෙය පැවැත් වූ අතර රද්දොලුගම මීසම් සේවක ගරු ප්‍රසාද් පෙරේරා පියතුමන් ප්‍රමුඛ කොටරුපේ ධර්ම සේවා සභාව වාර්ෂික මංගල්‍යය සංවිධානය කළහ.

රන්ජිත් ලොකුපෝතාගම

තියබෝල්ඩ් සමරතුංග

## ප්‍රේමයේ ගින්න හදවතේ දල්වාගෙන සාක්ෂි දරන්න



හෘදයසාක්ෂියට අනුව දෙවියන් වහන්සේගේ අපිරිමිත ප්‍රේමය නමැති ගින්නෙන් හදවත් දල්වා ගෙන යථාර්ථවාදිව කිතුනුවන් ලෙස සාක්ෂි දැරීමට කැපවන්නැයි කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ බක්මිගොල්ල සදාසරණ දේවස්ථානයේ වාර්ෂික මංගල දේව මෙහෙයේදී පැවසූහ.

කුරුණෑගල පදවි ජනසන්නිවේදන අධ්‍යක්ෂ බක්මිගොල්ල මීසම් සේවක ගරු ජෙරල්ඩ් ප්‍රනාන්දු පියතුමාගේ සංවිධානය මත හලාවත පදවියේ ගරු රනිල් පෙරේරා පියතුමාගේ සහභාගිත්වයෙන් යුතුව වාර්ෂික මංගල්‍යය පවත්වන ලදි.

බී. කේ. ටී. රෙජිනෝල්ඩ්

## කිතු සමිඳාණන්ට සමීපවීමේ මග කියයි



ඔබ ක්‍රිස්තුන් වහන්සේට සමීපවීමට නම් බැහැපත්කම, ඇහැමියාව, දහමට ලැදියාව ප්‍රගුණ කරගන්නැයි වත්තල සා. අන්තෝනි විදුහල්පති ගරු මාල් වර්ණසාන්ත පියතුමා කුරුකුලාව සා. ලාසරස් මුනි දේවස්ථානයේ වාර්ෂික මංගල දිව්‍ය යාගයේදී පැවසීය.

කුරුකුලාව මීසම් සේවක ගරු ප්‍රැන්සිස් ෆොන්සේකා පියතුමා මීසම්වාසී ජනතාව අධ්‍යාත්මිකව සූදානම්කිරීමේ අරමුණින්, විවිධ මාතෘකා යටතේ හරවත් දේශන සහිත ධර්ම විවේකයක් සංවිධානය කර තිබුණි.

සටහන - පද්මිණී නානායක්කාර

සේයා - එච්. ඒ. කල්දේරා

## 65 ජයන්තියට සැරසේ

මොරටුව මීසමේ මරිය හමුදාව ආරම්භ කර වසර 65 ක් ගතවීම නිමිත්තෙන් ලබන ඔක්තෝබර් 05 වැනිදා විශේෂ වැඩපිළිවෙලක් සිදුකිරීමට කටයුතු සූදානම් කරමින් පවතී.

නිවෙස් බැහැදැකීම් පවුල් ප්‍රශ්නවලට විසඳුම් ලබාදීම ඇතුළු ජනවන්දනා කටයුතුද මෙ මරිය හමුදා ප්‍රසිධියම සිදුකරයි.

රංජිත් කුරේ

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.com

ක්‍රිස්තු වර්ෂ 2013 සැප්තැම්බර් 22 ඉරිදා

# කතෝලික ගිහි, පැවිදි, පූජක පිරිසට දේශපාලනය අකැප නැහැ !

වතිකානයේ ඩෝමුස් සන්ටා මාර්තාහි පැවති දේව මෙහෙයකදී අතිඋත්තම ප්‍රැන්සිස් පාප් වහන්සේ විශේෂ සඳහනක් කොට ප්‍රකාශ කර සිටියේ ලෝකයේ වෙසෙන කතෝලික සැදැහැවතුන්, පැවිදි, පූජක සියල්ලන් විධිමත්ව දේශපාලනය තුළ කැපවීමක් කළ යුතු බවයි. මේ පිළිබඳව අද අප පත්‍රයේ මුල් පිටුවේ ප්‍රධාන පුවතද මතක් කර ඇත. ශු. සුවිශේෂයේ ශතාධිපතියාගේ කථාව හා ශු. පාවුළු තුමන් විසින් තිමෝති වෙත යැවූ හසුනද මතක් කරමින් ශුද්ධෝත්තම පියතුමා ගෙන හැර පෑ කරුණු කාරණා විශේෂ කොට ලෝක ජනමාධ්‍යයට ප්‍රධාන ප්‍රස්තුතයක් වූවාට සැක නැත. නමුත් ලෝක ජනමාධ්‍ය එය තේරුම් ගත් අයුරෙන්ම ආසියාකරයේ ජනමාධ්‍ය එය නිවැරදිව තේරුම් ගනිවි දැයි යන්න දැන් දැන් සැක සංකා මතුවෙමින් පවති.

මන්දයත් කතෝලික දහම ප්‍රේමයේ දහමක්ම නිසා ඒ දහම් පණිවිඩයේ එන ප්‍රේමය කුමක්ද යන්න කතෝලික සම්භවයක් හා පරිසරයක් ඇති ප්‍රදේශ හා රටවල් තේරුම් ගනු ලැබුවත් අන් ප්‍රදේශ හා රටවල් එය කෙලෙස අවබෝධකර ගනීද යන ප්‍රශ්නය නිතැතින්ම පැන නගින බැවිනි.

රාජ්‍ය පාලකයා ආදරයේ හා දැහැමියාවේ පාලකයෙක් විය යුතු බවට අති උත්තම සුදොතුම් පියතුමා මතක් කරන්නේ පෙර කී සුවිශේෂී ආදරය පදනම් කර ගෙනයි. දාවිත් රජතුමාගේ ආදර්ශය මතක් කරමින් ජනතාවට ආදරය කළ රජතුමෙක් හැටියට හා දැහැමියාවේ මූර්තියක් බවට දාවිත් පත්වූ ආකාරය සසුනිසුරාණන් ආවර්ජනය කරන්නේ දාවිත් බෙහෙවින්ම ජනතාවට ආදරය කළ රාජ්‍ය පාලකයෙක්වූ බවද අවධාරණය කරමිනි. එලෙසින්ම ශු. පාවුළු තුමා රාජ්‍ය පාලකයින් වෙනුවෙන් හා අධිකාරි බලය මෙහෙයවන්නන් වෙනුවෙන් යාච්ඤා කළ යුතු බව අවධාරණය කරන්නේ කුමක් අරභයාද යන්නද සුදොතුම් පියතුමා මතක් කරනු ලබයි. ජනතාව දේශපාලනයෙන් ඈත් නොවිය යුතුයි. ඈත් නොකළ යුතුයි.

පාලකයින් දැහැමි කරවීමට හා නිසි මං ගැන්වීමට ජනතාව තුළ ශුද්ධවූ අයිතියක් ඇත. යාච්ඤාව තුළ හා ආදර්ශවත් ක්‍රියාකාරිත්වය තුළ එය ඉටු කරන විට ඔහු ගිහියෙක්ද, පැවිදි හෝ පූජක ජීවිතය ගත කරන්නෙක්ද යන්න පටු චින්තනයක් තුළ සිරවී ප්‍රශ්න කළ යුතු නැත. එය සුදොතුම් පියතුමා දැඩිව අවධාරණය කරයි.

මෙහිදී පක්ෂ දේශපාලනයක් හෝ ආයුධ දේශපාලනයක් ගැන සඳුන් පියා කොතැනකවත් හුවා දැක්වීමක් කර නැත. එය විශේෂයෙන්ම අවබෝධ කරගත යුත්තකි. දකුණු අමෙරිකාවේ, උතුරු අමෙරිකාවේ, යුරෝපයේ, නැගෙනහිර යුරෝපයේ හා මැද පෙරදිග රාජ්‍යයන් හි නායකයින් වෙතද ඔවුන්ගේ නියෝජිතයින් වෙතද, ජනතාව වෙතද සිහි කැඳවා ඇති මේ පුණ්‍ය බවේ කැඳවීම් ජීවිතය පිළිබඳව පහන් සිතින් අවබෝධ කොට ක්‍රියා කිරීමට ඔවුන් දැන් සිටම යම් පෙළඹවීමකට යොමුවී ඇතැයි යන්න හුවා දක්වන ප්‍රවෘත්ති පවා යම් තාක් අස්වැසිල්ලට කරුණකි. ක්‍රිස්තියානියේ පරිකල්පනය තුළ ආදරය යනු කුමක්ද යන්නත් එලෙසින්ම ආබ්‍රහම්ගේ දරු කැල තුළ ඇති දෙවිඳුන් කෙරෙහි අසීමිත භය භක්තියත් මේ වෙනස්කම් හා අවබෝධතා වෙනුවෙන් බලපා ඇති බව අවිවාදයෙන්ම පිළිගත යුත්තකි.

නමුත් ආසියාව තුළ ආදරයේ, ප්‍රේමයේ දැහැමියාවේ නැඹුරුවක පාලන තන්ත්‍රයක් ඇත්ද යන්නත්, එලෙසින්ම ඒ ආදරය තුළ කතෝලිකයා හට විශේෂයෙන් පැවිදි, පූජක පිරිස් වෙත සහභාගිත්වය කෙලෙස සිදුවිය යුතුද යන්නත් අවශ්‍යයෙන්ම විමසා සිටිය යුතු ප්‍රශ්නයක්ව පවතී.

අප ශ්‍රී ලංකාව තුළත් එහිලා කිසිදු වෙනසක් නැත. දේශපාලනයේ පක්ෂ බලවතුන් වෙනස් වන හැටියට මනස සකස් කර ගන්නට පෙළඹී සිටින අප ජනතාව අතර කතෝලිකයන්ද සිරවී ඇති සෙයක් පෙනේ. එක්සත් ජාතික පක්ෂය ආණ්ඩු සමයේ එම දේශපාලනයට විරුද්ධ වූ සමහර කතෝලිකයින් කළ එළි බැස්සේ මහා විමුක්තිකාමීන් ලෙසය. ඉරණවිල. නොරොච්චෝලේ වැනි පාරිසරික ප්‍රශ්න ඇති කරවන තීරණ වලදී එකල රජයේ ක්‍රියාමාර්ගයන් දැඩිව විවේචනයට ලක් කළ සමහර ගිහි කතෝලිකයින් රදගුරු හිමිපාණන්ට පවා පරිභව කළේ ජනතා ප්‍රශ්න අමතක කරන පරිසිවරුන් බවට ලේබල්ද ගසමිනි. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා ඒකාබද්ධ වූ පක්ෂ තුළින් අලුත් ආණ්ඩුවක් ආ විගස ඒ මහා විප්ලවවාදීන් තටු අකුලා ගත්තේ රදගුරු තුමන්වද තනි කරමිනි. නමුත් සලාපුර හිටපු රදගුරු හිමි ආදරයේ හා දැහැමියාවේ දේශපාලනය තුළ අවසානය දක්වා නිරත වූයේ මුළු ජනතාවට ආදරය කරමිනි.

මන්නාරම රදගුරු අති උතුම් රායප්පු ජෝශප් හිමිපාණන්ව නිර්දය ලෙස අදත් විවේචනය කරන්නේ එදා වෙනත් ආණ්ඩුවක් තිබෙන කොට ඊනියා විමුක්තිකාමී අමුතු බණක් දෙසූ සමහර කතෝලිකයෝම නොවේත්ද? එහෙත් එතුමන්ගේ දේශපාලනය ජනතාවට ආදරය කරන දේශපාලනයකි. පරිසරය හඳුනා ගත් දේශපාලනයකි. සුදොතුම් පියතුමා සිහිපත් කරන්නේ කතෝලිකයන්ට සුදුසු ඒ ආදරයේ දේශපාලනය ගැනයි. යහපත් ලෙස ඒ දේශපාලනයට ඇඟිලි ගසන ලෙසයි.

ස්වර්ගස්ථ ගරු මයිකල් රුදිගු පියතුමාගේ අරගලය අද සිදුවූවා නම් එදා එතුමන්ව වීරයෙක් කළ පක්ෂ දේශපාලනයේ මඩ ගොහොරුව තුළ සිටි සමහර කතෝලිකයිනට අද එතුමා දුෂ්ඨයෙක් වන්නටද බොහෝ සෙයින් ඉඩ තිබේ.

පක්ෂ මාරුවී දේශපාලනය වෙනස් කරන චින්තනය උඩුයටිකුරු කරන ආසියාවේ දේශපාලන තන්ත්‍රයට සම්බන්ධ කතෝලිකයිනට නම් සසුනිසුරාණන්ගේ මේ දේශපාලන විග්‍රහය ඒත්තු යන්නට තවත් කලක් ගතවිය හැකියි. ජාතිවාදි පක්ෂ බිහිනොකර, ජාතිවාදි අදහස් තුළට ගොනුවී අධිපති කාම භෝගයෙන් දෑස් දල්වා බලා සිටින හා පනින දේශපාලන සත්ව කොට්ඨාශයක් බවට පත් නොවී මේ රට තුළත් ආදරයේ දේශපාලනයක් තුළ ක්‍රියාකාරී වීමට ගිහි, පැවිදි, පූජක සැමට කාලය එළඹ ඇති බව සසුනිසුරාණන්ගේ පණිවිඩය මතක් නොකරයිද? සැබවින්ම එය මතක් කිරීමක්මයි.

# ගුණගරුක ළමා පරපුරක් ගොඩනැගීමට නම්



අද රජයේ පාසල් අධ්‍යාපන පද්ධතියේ ආගම විෂය සඳහා සතියකට වෙන්කර ඇති කාල පරිච්ඡේද ගණන දෙකකි. පාසල් රජයට ගැනීමට පෙර නම් කාල පරිච්ඡේද පහක් (05) වෙන්කර තිබිණි. ඒ අනුව ළමුන්ගේ ගුණධර්ම වර්ධනය 40% දක්වා පහළ බැස ඇත. එදා තිබූ ගුණ දහම් ඵලදාව 60% කින් අඩුවී තිබීම පුදුමයට කරුණක් නොවේ.

අද ගුරු වෘත්තිය සැකසී ඇත්තේ ද එදා මෙන් සේවයක් ලෙස නොව, රැකියාවක් විලසිනි. මෙයට හේතු පාදක වන කරුණු රාශියක් තිබෙන නිසා ගුරුවරුනට පමණක් දොස් පැවරිය නොහැකිය. රැකියා හිඟයට පිළියම් වශයෙන් උපාධිධාරින්ගේ පටන් අපොස සමත් අය දක්වා ඇති අතිවිශාල රැකියා විරහිත තරුණ පිරිසක් අතරින් ඉතා සුළු කොටසකට ගුරු පත්වීම් දෙනු ලැබේ. ඒවා දෙන්නේද අනාථ ආධාර ලබාදෙන ලෙස ටෝකන් ක්‍රමයකට විනා එකිනෙකාගේ සුදුසුකම් වලට අනුව දෙනු ලබන පත්වීම් නොවන බවද පෙනීයයි.

මෙලෙසින් හැල්ලුවට ලක්වෙමින් පවතින ගුරු වෘත්තියට පිවිසෙන නවක ගුරු භවතුන් ගෙන් අතිඋසස් සේවාවක් බලාපොරොත්තු විය නොහැකිය. අද ආරක්ෂක හමුදා වලට බඳවා ගන්නා තරුණ තරුණියන්ට එම පත්වීම් දීමට පෙර නිසි හමුදා පුහුණුවක් ලබාදීමෙන් ඔවුන්ගේ දක්ෂතා, සිතුම් පැතුම් ඒකාග්‍ර අරමුණකට යෙදවීමට හැකිවන බව අපි දනිමු. මෙසේම අපට ඵලදායී සේවාවක් ලබාගැනීමට අප තෝරාගන්නා ආධුනිකයින්ට ඒ වෘත්තියට අවශ්‍ය දැනුම හා නිසි පුහුණුව ලබාදීමෙන් ඔවුන්ගේ කාර්ය භාරය ඔවුන්ට තහවුරු කරදීමෙන් ඔවුන්ගෙන් කාර්යක්ෂම සේවයක් බලාපොරොත්තු විය හැකිය.

මේ අනුව ඵලදායි ගුරු සේවයක් ලබාගැනීමට නම් තෝරාගැනීමට පෙර සිටම ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. පළමුව ගුරු සේවයට කැමති අයට තරග විභාගයක් පැවැත්විය යුතු අතර, අපොස උසස් පෙළ කිරීමට සම්මාන අවශ්‍ය වන්නාක් මෙන්, ගණිත, විද්‍යා ගුරු විභාගයට ගණිතය හා විද්‍යාවට සම්මාන සාමාර්ථ තිබිය යුතු අතර, කලා විෂය ධාරාවට ගණිතය සමත්, සිංහල හා තවත් විෂයකට සම්මාන බලාපොරොත්තුවීම සුදුසුය. වාණිජ හා කෘෂිකර්ම, අත්කම්, නැටුම්, සංගීත, චිත්‍ර ආදියටද ඒ ධාරාවන්ට අදාල විෂයට සම්මාන තිබිය යුතු අතර, ආගම විෂය උගන්වන ගුරුවරුන්ටද ආගම් විෂයට සම්මාන අවශ්‍ය විය යුතුය.


මේ ආකාරයෙන් එක් එක් විෂය ධාරාවන් ඉගැන්වීම සඳහා අවශ්‍ය ගුරුවරුන් තෝරා ගැනීමට තරග විභාගයක් පැවැත්වීම, ඉන්පසු සම්මුඛ පරීක්ෂණයක් පවත්වා මේ රැකියාවට වඩා සුදුසු, එසේම කැමති අයව තෝරා ගත යුතුය. ඒ අයටද අදාල විෂය ඉගැන්වීමට අවශ්‍ය මූලික පුහුණුවක් (තුන් මසකවත්) ලබාදී විදුහල්පතීන් හා උපදේශකවරුන්ගේ අධීක්ෂණය යටතේ ඉගැන්වීමට පුහුණුවක් දිය යුතුය. ඔවුන් අවුරුදු දෙක (02) ක හොඳ සේවාවක් කිරීමෙන් පසු ගුරු විදුහල් ප්‍රවේශ විභාගයකට ඉදිරිපත්වීමට දී, එයින් සමත්වන අය වාර්ෂිකව තෝරාගෙන අදාල විෂය ධාරා යටතේ පුහුණුකර, පුහුණු ගුරුවරුන් ලෙස පත්වීම් ලබාදී ක්‍රමවත් සැලැස්මක් යටතේ සාධාරණ ලෙස ඔවුන් විදුහල් වලට අනුයුක්ත කළ යුතුය. ඒ අතර, දුෂ්කර ප්‍රදේශවල සේවය අවුරුදු දෙකක උපරිම කාලයකට සීමා කිරීමෙන්, සෑම පාසලකටම අවශ්‍ය ගුරුවරුන් ලබාදිය හැකිවනු ඇත. මෙලෙස වාර්ෂිකව ඇතිවන පුරප්පාඩු අනුව මෙම පත්වීම් ක්‍රමය ක්‍රියාත්මක කළයුතු අතර, විශ්‍රාමික වයස් සීමාව 55 ට සීමා කිරීමෙන් ද සෑහෙන පිරිසකට ගුරු වෘත්තියට පිවිසීමට අවස්ථාව ලබාදිය හැකිය.

ඉංග්‍රීසි, සිංහල, සංගීත. කලා, ගණිත, විද්‍යා මෙන්ම ආගම ධර්මය ඉගැන්වීමටද විශේෂ පුහුණුවක් ලබාදී ආගමික ගුරු පරපුරක් බිහිකළ යුතුය. ඒ ගුරුවරුනටද අනෙක් ගුරුවරුනට මෙන් නිසි සැලකිලි දැක්වීමෙන් ආගම විෂය ධාරාව ඉගැන්වීම ක්‍රමවත් ලෙස සකස් කළ හැකිය. එක් එක් ආගමික අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් පත් කිරීමෙන් තම ආගමික අධ්‍යාපනය දියුණු කරගැනීමට ඔවුන්ට අවස්ථාව උදාකර දිය හැකිය. මේ සියල්ල අධ්‍යාපන අමාත්‍යාංශ මට්ටමින් ඉටුකළයුතු අතර, ඒ පිළිබඳ විශේෂ උනන්දුවක් දැක්වීමෙන් අප රටේ සාරධර්ම පිරිහීම වළක්වා ආගමික නැඹුරුවකින් යුතු, අධ්‍යාත්මික ගුණගරුක ළමා පරපුරක් අපට අනාගතයේ දී සකසා ගැනීමට හැකිවෙනු ඇත.

ආගමික ගුරුවරුන් තෝරා ගැනීමේදී දහම් පාසල් ගුරුවරුන්ට හා ධර්මාචාර්ය විභාග සමත් අයට විශේෂ ලකුණු ක්‍රමයක් සකස් කිරීමෙන් දහම් ගුරුවරුන් තෝරාගැනීමට එය විශේෂ උදව්වක් වනු ඇත. මෙම ආගමික ගුරුවරුන් දහම් පාසල්වල උගන්වන්නේ නම් ඔවුනට විශේෂ දීමනාවක් දීම, ඔවුන්ගේ සේවය අගැයීම ආගමික ආයතන මගින් කිරීම ඉතා ඵලදායක වනු ඇත. මේ මගින් හොඳ දහම් පාසල් අධ්‍යාපනයක් සකස් කරගැනීමට අවස්ථාව උදාවන අතර, අනාගතයේදී සාරධර්ම වලින් පොහොණි වූ යහපත් ළමා පරපුරක් අපට සකස් කරගත හැකිවනු ඇත.

වෙන්නප්පුවේ
**වික්ටර් දෙහිපිටිආරච්චි**

## කැමිලස්ගේ තිත්ත ඇත්ත



# අපගේ ජීවිතයේ පළමු තැන දෙවි සමිඳාණන්ට දෙමු

තම පවුලේ අයට මෙන්ම අන් අයටද සැබෑවූ ප්‍රේමයක් දෙන්නට හැකිවන්නේ දෙවි පියාණන්ට අපගේ ජීවිතයේ පළමු තැන දෙන්න පුලුවන් අයට පමණයි. ජීවිතයේ සතුට සැනසුම අත්දකින්නට පුලුවන් සමිඳුන් සමගම ජීවත්වන අයටයි. ජීවිතයේ සැම කඳුලක්ම, දුකක්ම විඳ දරාගනිමින් උන්වහන්සේ තුළ ජීවත්වන්නාට අවශ්‍ය දේ දෙන්න උන්වහන්සේ සූදානමින් සිටිනවා.



හලාවත රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් මෙම අදහස් පළකළේ කහටවිල සා. විනිප්‍රිඩා මුනිවරියගේ වාර්ෂික මංගල්‍ය දිව්‍ය පූජා යාගයේදීය.

හලාවත පදවි පරිපාලක අතිගරු පැට්‍රික් විජේසිංහ ගරු ගොඩ්ප්‍රි නෙල්සන් පියතුමන් මංගල දිව්‍ය යාගයට හවුල් විය. නොයෙකුත් ප්‍රදේශවලින් බැතිමතුන් විශාල පිරිසක් මංගල්‍යයට සහභාගි වූහ.

සටහන - එලිසබෙත් ඇන්, සේයා - ජී. බී. එච්. ලිවේරා

## සෑම පූජක පුතකුම දේව තිළිණයකි

එදා කිතු සමිඳුන් ගිය මග යමින් දේව වචනය සමාජය තුළ මාංශගත කිරීමේ අසීරු අභියෝගයටත් ඒ ඔස්සේ වඩා යහපත්වූ ලෝකයක් ගොඩනැගීමේ භාරදූර වගකීම් රැසකටත් උරදෙමින් කිතු සමිඳුන් තුළ පූජක දිවිය ගෙවන කුලියාපිටිය මීසම් සේවක ගරු සිඩ්නි රොෂාන් ලියනගේ පියතුමන්ගේ පූජකවර සමරු තුති දීමේ දිව්‍ය පූජා යාගය කුලියාපිටිය ශු. ජුසේ මුනිඳුන්ගේ දේවස්ථානයේදී පැවැත්විය. මෙය සංවිධානය කළේ කුලියාපිටිය විවාහ හමු සංසයයි.

රීටා සේනානායක



කලඑළිය සා. ජුවකීනු මුනිතුමාගේ වාර්ෂික මංගල්‍ය වෙනුවෙන් ප්‍රදේශයේ දිළිඳු පවුල් 16 කට කලඑළිය විසෙන්ති පාවුලා සමිතිය වියලි ආහාර ප්‍රදානය කිරීමේ පුණ්‍ය ක්‍රියාවක් සංවිධානය කර තිබුණි. මීසම් සේවක ගරු තරංග සම්පත් පියතුමා එම වියලි ආහාර මලු බෙදා දෙන අයුරු.

ඩබ්. එම්. ලෙස්ලි පෙරේරා

## කිතුනු ඒකක නායකයින් දැනුම්වත් කිරීමේ වැඩසටහනක්

කුරුණෑගල පදවියේ වල්පිටගම මීසමට අයත් දේවස්ථානවල කිතුනු ඒකක නායක නායිකාවන් දැනුම්වත් කිරීමේ වැඩ සටහනක් පසුගියදා පැවැත්විණ.

වල්පිටගම දේවස්ථානයේදී පැවැති මෙම වැඩ සටහන මෙහෙයවනු ලැබුයේ කුඩා කිතුනු සංඝ පදවි අධ්‍යක්ෂ ගරු රූපස් තැලිස් පියතුමා ඇතුළු කණ්ඩායම විසිනි. යායමුල්ල, නවසිගවත්ත, නාබිරිත්තන් කඩවර, වල්පිටගම යන දෙව් මැඳුරු වලට අයත් නායක නායිකාවන් පනස් දෙනෙක් පමණ මේ සඳහා සහභාගි වූහ. කිතුනු ඒකක නඟා සිටුවීමේ අරමුණින් මෙම වැඩසටහන සංවිධානය කරනු ලැබුයේ මීසම් සේවක ගරු නීල් ක්‍රිෂාන්ත පියතුමාගේ අදහසක් අනුවය.

ටී. එම්. පී. සන්ධ්‍යා කුමාරි



තිඹිරිගස්කටුව ප්‍රේමචන්ද්‍රවත්ත සා. ආනා මව්තුමියගේ දෙව්මැඳුරේ 23 වන වාර්ෂික මංගල දෙව්පුද මෙහෙය සඳහා ආරාධිත උතුරු කොළඹ කලාපීය නාහිමි අතිගරු පැට්‍රික් පෙරේරා පියතුමා සහ මීසම් සේවක ගරු ශ්‍රිකාන්ත ප්‍රනාන්දු පියතුමා මංගල දෙව්පුද මෙහෙය සඳහා පුදසුන වෙත පියනඟන අවස්ථාවයි මේ.

ඇග්නස් සියඹලාපිටිය

## වග දිව්‍ය සත්ප්‍රසාද මංගල උලෙළ

මග මීසම් ජනතාව දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යය මහත් හරසරින් පැවැත්වූහ. වග මීසම් සේවක ගරු ප්‍රසන්න සංජීව හා සහායක ගරු ක්ලෙමෙන්ට් සංජීව පියතුමන්ගේ මූලිකත්වයෙන් දින තුනක් සූදානම් වීමේ මෙහෙයයක් කහහේන මධ්‍යස්ථානයේදී පවත්වන ලදි.

උදෑසන ශු. ජපමාල උච්චාරණයෙන් පසු දිව්‍ය පූජාව පැවැත්විය. දෙව්මවුන් හා දිව්‍යසත්ප්‍රසාදය පිළිබඳ අගනා දේශනයක් මගින් ජනතාව දැනුම්වත් කළ අතර දිව්‍ය පූජාවෙන් පසු දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩමවා වත්තල සා. අන්තෝනි විදුහල් තූර්ය වාදක කණ්ඩායම පෙරදැරිව අලංකාර ලෙස සැරසූ රථයෙන් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩවමින් විශාල ජනතාවකගේ සහභාගිත්වයෙන් යුතුව යාච්ඤා කරමින් හා ගීතිකා ගයමින් පෙරහරින් මාවල්ගම සා. සෙබස්තියන් දෙව් මැඳුර වෙත පැමිණියහ.

ග්‍රේටා පෙරේරා



වැලිවිට උත්පත්ති මාතාවන්ගේ වාර්ෂික මංගල්‍යයට සමගාමීව දෙවන නොවාන කොට්ඨාශයේ සැදැහැවතුන් විසින් වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු කඩුවෙල මහ නගර සභික ලක්මාල් විලත්ගමුව මහත්වරුන් සහ කොට්ඨාශයේ මුස්ලිම්, බොදුනු සැදැහැවතුන්ගේ සහය ඇතුව මාලබේ දෙසින් වැලිවිටට ප්‍රවිෂ්ඨ වන රෝහණ විලත්ගමුව මාර්ගය අසල ඉදිකරන ලද උත්පත්ති මාතාවන්ගේ පිළිරුව වැලිවිට මීසම් සේවක ගරු අර්නස්ට් ද මැල් පියතුමා ආසිරිගැන්වූ මොහොත.

එම්. ජෝ. පාරිස්

## මොරටු දිසාවේ මරිය හටයෝ මරිය හමුද දිනය සමරති

කොරළවැල්ල ශු. මිඛායෙල් තුමන්ගේ දෙව්මැඳුරේදි මොරටු දිසාවේ දෙටු කනිටු මරිය හටයන්ට ඥානකාන්තියක් පවත්වන ලදි. කොමිටිසියමේ ආත්මික අධ්‍යක්ෂ ගරු සුනිල් වේරගොඩ පියතුමා සහ ප්‍රැන්සිස්කන් නිකායේ ගරු රොෂාන් පියතුමන් විසින් ඥානකාන්තිය මෙහෙයවන ලදි.

මරිය හටයා අන් අයගේ ආත්ම ගලවා ගැනීම සඳහා දේව රාජ්‍යය ගොඩනැගීම සඳහාත් කැපවී සේවය කරන්නෙකි. එසේනම් මරිය හටයා පළමුව ශුද්ධවන්ත විය යුතුයි. තම ජීවිතාදර්ශය තුළින් අන් අය කිතුනු අනුගාමිකයන් කරන්නකු විය යුතුය. ගරු සුනිල් වේරගොඩ පියතුමා පැවසීය.

මරිය හමුදා නිර්මාතෘ ප්‍රැන්ක්ඩස් සොහොයුරා ඇල්පිලැම්බ් සොහොයුරා ඒඩල් කුවින් සොහොයුරිය භාග්‍යවරයට ඔසවන ලෙස පතමින්, මරියහටයන්ට 92 වසරක් පුරා දුන් ආසිරි වරම වලට පිය දෙවි සමිඳුන්ට තුති පුදමින් තුති ප්‍රශංසාවේ දිව්‍ය පූජා යාගය පියතුමන් දෙපල විසින් පුදන ලදි.

ජිනවලි ස්වර්ණලතා පීරිස්



නාත්තන්ඩිය නිර්මල ලූර්දු දේවමාතා සිද්ධස්ථාන පාලක ගරු උපාලි චර්චිල් පියතුමන්ගේ සංකල්පයකට අනුව සර්වරාත්‍රික මෙහෙයක් සිදුකරන ලදි. සැදැහැවත් විශාල පිරිසක් මේ සඳහා සහභාගිවූ අතර පවුල් යැදුම් මෙහෙය තුළින් ප්‍රසාද ස්නාපන පොරොන්දු අලුත් කරමින් දෙවිඳුන්ට ප්‍රශංසා කළ අයුරු.

ශ්‍රියාංගණී පිලීෂියා

## අපගේ එකම අරමුණ ස්වර්ගීය ගමනයි

අපගේ එකම අරමුණ හා ඉලක්කය දෙව් මව් ලෙස ස්වර්ග රාජයට ගමන් කිරිම බවත්, අප මේ ජීවත්වනුයේ තාවකාලික ලෝකයක බවත්, යහපත් ජීවිතයක් තුළින් අපටත් ස්වර්ගරාජ්‍යය ළඟා කරගත හැකි බව ගරු හියුගෝ පලිහවඩන පියතුමා පැවසීය.

කම්කරු මහ ලේකම් කාර්යාලයේ පැවති විශේෂ දේව මෙහෙයට එක්වෙමින් පියතුමා එසේ පැවසීය.

මරිය තුමියගේ ප්‍රතිමාවට සැම සාමාජිකයකු මල් පූජා කිරීමෙන් අනතුරුව දේව මෙහෙය ආරම්භ කළ අතර කම්කරු අමාත්‍යංශය, කම්කරු දෙපාර්තමේන්තුව හා සේවා නියුක්ති භාර අරමුදල් මණ්ඩලයේ කිතුනු හවුල විසින් මෙය සංවිධානය කොට තිබුණි.

චින්තක ද මැල්

## සාලියන්කුලම් වේලන්කන්නි දේවස්ථානය

1979 දී එවකට මීසම් සේවකව සිටි ගරු සාර්ටෝ නෝනිස් පියතුමා නොයෙකුත් රෝග පීඩාදියෙන් පීඩාවිඳි ජනතාව ගැන සානුකම්පිත බව පෙරදැරිව මීසමේ අතිකුත් වැඩ වලට අමතරව සතියකට දිනක් රෝගීන් වෙනුවෙන් වෙන් කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස සුව සහනය ලත් පරිත්‍යාගී පවුලක් මගින් එතුමා ලද තිළිණය වූයේ ආරෝග්‍ය මාතා (වේලන්කන්නි) ප්‍රතිමාවයි. එතුමන් විසින් එය ස්ථාපිත කරන ලද්දේ ඉහත කී සුන්දර භූමිභාගයේය.

ඞ1991 පමණ වන විට මුහුදුකෑම ඉතා ඇඩි ලෙස සාලියන්කුලම ග්‍රාමයේ වෙරළ තීරය ආක්‍රමණය කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මුහුදු රළ දේව මාතා ප්‍රතිමාව අබියසට පැමිණෙන්නට විය. එවකට මීසම සේවක ගරු ජුලියන් හයසින්ත් ප්‍රනාන්දු පියතුමාගේ මැදිහත් වීමෙන් කන්නලව් යැදුම් මෙහෙයක් පැවැත්විය. පසුදා පටන් මුහුදු රළ ක්‍රම ක්‍රමයෙන් ප්‍රතිමාවෙන් ඈත් විය. එදා දියමත සෑදී තාවකාලික පූදසූන ගොඩබිම ස්ථිර එකක් බවට පත්විය.





ක්‍රි. ව. 2000 දී මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් පියතුමාගේ මගපෙන්වීම හා කැපවීම මත වර්තමාන දේවස්ථානය ගොඩනැගෙන්නට විය. එපමණක් නොව සෑම බ්‍රහස්පතින්දා දිනකම සවස 4.00 ට නුවානය සමග දිව්‍ය පූජාවද රෝගීන් ආසිරි ගැන්වීමද නුවානය සඳහා කුඩා අත් පොතක් ද මුද්‍රණය කැරිණ. 2004 දී මීසම සේවකව පැමිණි ගරු ලක්සිරි ප්‍රේමලාල් ප්‍රනාන්දු පියතුමා නුවානය නොකඩවා පවත්වා ගෙන ආ අතර 2012 වසරේ මීසම සේවක ලෙස පැමිණි ගරු ෆීලික්ස් කොළඹගේ පියතුමාගේ අප්‍රතිහත උනන්දුව හා කැපවීමත්, මගපෙන්වීමත් නිසා වඩාත් විධිමත් අයුරින් නුවානය හා දිව්‍ය යාගය සිදුවේ. විශේෂයෙන් ඒ සඳහා කැපවූ ස්වේච්ඡා කණ්ඩායමක් සෑම බ්‍රහස්පතින්දා දිනකම ගරු පියතුමන්ට සහයෝගය දක්වති. එදා ගං ඉවුර ආසන්නයේ පිහිටි මෙම පුද බිම අද මීටර් 500 ක් පමණ ඈතට විහිදී යන සුදෝ සුදු පුලින තලාවක පිහිටි බොහෝ දුරබැහැර සිටින්නවුන් ළං කරවන ඉතා සුන්දරවූත් රමණීයවූත් පුද බිමකි.

සැප්තැම්බර් මස 29 වැනි ඉරුදින මංගල්ලය යෙදේ.

රොහාන් සුරාජ් ප්‍රනාන්දු



බෝපිටිය මීසම් සේවක ගරු එරින්ටන් සිල්වා පියතුමා ප්‍රමුක සහෝදර පියතුමන් සිය පූජක දිවියේ සමරු දිව්‍ය පූජාවෙන් පසු ප්‍රදීප කැමරාවට මුහුණ දුන් අයුරු.

ක්‍රිස්ටි ඔස්මන් පෙරේරා

## නැසීගිය දෙස්තර ජයලත් ජයවර්ධන නමින් මාවතක් නම්කැරේ



ගම්පහ දිස්ත්‍රික් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී (එ.ජා.ප) දිවියෙන් සමුගෙන තෙමසක් පිරීම ඉකුත්දාට යෙදී තිබුණි. මෙදින මෙතුමා විසින් රට ජාතිය ආගමට කරන ලද විශිෂ්ට සේවයට කෘතගුණ සැලකීමක් වශයෙන් ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීමක් පරිදි වෑවල පල්ලිය පාර දොස්තර ජයලත් ජයවර්ධන නමින් නම් කිරීමේ උත්සවයක් පසුගියදා පැවැත්වුනි. එම මාවත විවෘත කිරීම වැලිගම්පිටිය මීසම් සේවක ගරු ශ්‍රී ලාල් පොන්සේකා පියතුමා සහ එ.ජා. පක්ෂ ජාතික සංවිධායක, එ.ජා.පක්ෂ යේ ව්‍යාපාරික සංගමයේ අනුශාසක, සේදවත්ත වේරගොඩ පුරාණ රජ මහා විහාරස්ථානාධිපති පෑලියගොඩ අඹන්විල ඥානාලෝක හිමි විසින් සිදු කරන ලදි. ඉන් අනතුරුව එම මාවතේ සිට ජයලත් ජයවර්ධන මහතාගේ නිවසේ පවත්වන ලද දිව්‍ය පූජා යාගයට සහභාගි වීමට පිරිස පයින්ම ගමන් කළහ. මෙම උත්සවය සංවිධාන කටයුතු සිදු කිරීම ජයලත් ජයවර්ධන මහතාගෙ පුත් වෛද්‍ය කාවින්ද්‍ය මහතා අතින් සිදුකෙරුණි.

ඩබ්. එම්. ලෙස්ලි පෙරේරා

# වේදනාව දෙවිඳුන්ගේ තිළිණයක් ද?



**අපගේ දෛනික දිවි පෙවෙත තුළ විවිධ අත්දැකීම්, සිත් රිදීම් වලට මුහුණ පාන්නට සිදුවේ. එය සාමාන්‍ය දෙයකි. එබඳු අවස්ථාවල අප දුර්මුඛ වේ.**

අතිශයින් කැළඹීමට පත් වේ. මෙහිදී අප මතකයට ගත යුතු දෙයක් පවතී. එනම් ඒ සෑමෙකක්ම අපට පමණක් නොව අන්‍යයන්ට ද අත්දකින්නට සිදුවන බවයි. එහෙත් එම යථාර්ථය අපට නොපෙනේ. සමහර විට අපටත් වඩා සිය දහස් ගුණයකින් ඔවුන්ගේ වේදනාවන්, කඳුළු පවතී. එපමණක් නොව අපට පෙරාතුව ක්‍රිස්තුන් වහන්සේ ස්වකීය කුරුස ගමන තුළ වදනින් විග්‍රහ කළ නොහැකි අන්දමට දුක් පීඩා වලට අයත් වූ බවද පරම යථාර්ථයකි.

කායික, මානසික, සමාජයීය, ආධ්‍යාත්මික වශයෙන් ද අන්ත අසරණ තත්ත්වයකට එතුමෝ මුහුණ දුන්නෝ ය. තුවාල 5455 ක් උන්වහන්සේගේ ශ්‍රී සිරුරෙහි පැවතිනි.

එපමණක් නොව ඉතා පහත්, නින්දිත අත්දැකීම වලට ද උන්වහන්සේ මුහුණ දුන් සේක. ඒ නිසා අපගේ වේදනාකාරී අත්දැකීම වලදී අප විසින් කළ යුතු ප්‍රධාන දෙයක් ඇත. එනම් ජේසු සමිඳුන්ගේ ශ්‍රී කුරුසයේ වේදනාවලියට අප බද්ධ විය යුතු බවයි.

එතුමා හෙළූ ශ්‍රී රුධිර ධාරා වලින් අපගේ කායික, මානසික, සමාජයීය, ආධ්‍යාත්මික තුවාල සුව වන බව භාවනාවට සම වැදී අත්දකින්නට උත්සාහ දැරිය යුතුය. ජේසු සමිඳුන් අපගේ දුක් වේදනා වලදී අපට සැනසෙන්නට, සතුටු වන්නට යම් යම් දේවල් ලබා දී ඇති බවද කල්පනාවට ගත යුතුය. එතුමා අපට යම් දෙයක් නොදෙන්නේ අපට එය නුසුදුසු නිසා වීමට පුළුවන. එයින් අපට නරකක් නපුරක් වීමට ඉඩ තිබෙන නිසා වීමට පුළුවන.

පසු කලකදී අපට එය ලැබීම සුදුසු නිසා විය හැකිය. නොඑසේ නම් උන්වහන්සේ අපගේ ජීවිතය හා බැඳුණු සැලසුම්වල මිනිස් මනසට ගෝචර නොවන කරුණක් නිසා වන්නට හැකිය. එහෙත් එය අපට අවබෝධ කර ගැනීම ඉතා දුෂ්කරය. ඒ සඳහා අප ශුද්ධාත්මාලෝකය, මඟ පෙන්වීම විශේෂාකාරයෙන් ලබා ගත යුතුය. දෙවියන් වහන්සේ අපගේ ජීවිතය නමැති නිවසේ එක් දොරක් වසන්නේ තවත් දොරක් විවර කිරීමට බව අප මනසට ගත යුත්තකි. දුක් පීඩා මඟින් අප දෙවිඳාණන් අත් දකින්නට උපරිම ලෙස ප්‍රයත්න දැරිය යුතුය.

ඇතැම් විට අපට ලෙඩ දුක්, කරදර, රෝගාබාධ නැතිනම් අප දෙවිඳුන්ගේ තුරුල්ලෙන් මිදෙන්නට ඇති අවස්ථා රැසක් ඇත. ශුද්ධවූ පාවුළු තුමාගේ ඉතා වේදනාකාරී තත්ත්වයක් පැවතිනි. එය ඉවත් කරන ලෙස ඉතා බැහැපත් අන්දමින් තුන්වරක් යැදීය. එය ශුද්ධ බයිබලයෙහි අඩංගු වේ.

එහෙත් දෙවිඳුන් එය දුරු නොකළ අතර ඉන් අනතුරුව එතුමා එම වේදනාව හා පොර නොබදා දෙවිඳුන් සමඟ ක්‍රියා කරන්නට ජීවත් වන්නට පොරොන්දු විය. මෙලොව වෙසෙන සෑම අයකුටම තමන් අප්‍රිය කරන, අමිහිරි දෙයක් හෝ දේවල් ඇත.

එසේ වුවද ඒ හා උරණ නොවිය යුතුය. එයට ආදරය කර පිළිගත යුතුය. බාරගත යුතුය. එවිට එම අමිහිරි දෙය ඉමියුරු දෙයක් බවට දෙවිඳාණෝ පත් කරති.

නිදර්ශනයක් ලෙස ජේසු සමිඳුන්ගේ ශ්‍රී කුරුස ගමන කඳුළු සයුරක් මෙන් සුවිශාලය. සංකීර්ණය. එහෙත් එය සමඟ එතුමෝ උරණ නොවූහ. එහි අවසාන ප්‍රතිඵලය වූයේ උන්වහන්සේගේ පරම රමනීය උත්ථානයයි. සකල ලෝක සත්ත්වයන්ට විමුක්තිය ලැබීමයි. ස්වර්ග රාජ්‍යයේ අති උත්තුංග අයිතියට මිනිසුන් හිමිකරුවන් වීමයි. එය ආනන්දනීය අත්දැකීමකි. එලෙස අපට පැමිණෙන දුක් කරදර, අසහනයන් මැද තනි නොවී ඉහත යථාර්ථයට යථාර්ථයක් වන්නට ශුද්ධාත්මය බලය පතමු.

✍ **මලින්ත බෝපෙආරච්චි - දළුගම**



## 06 ඇදහිල්ල

"දේවයන් වහන්ස, ඔබේ ප්‍රශ්නයට පිලිතුරු දීමට අපට වුවමනා නැත. දේවයන් වහන්ස ඇවිලෙන ගිනි උදුනෙන් අපව ගලවා ගන්න පුළුවන් දෙවි කෙනෙක් සිටී නම්, ඒ අප වැඳුම් පිදුම් කරන දෙවියන් වහන්සේමය. ඔබේ අතින් උන්වහන්සේ අප ගලවන සේක. "දේවයන් වහන්ස, උන්වහන්සේ එසේ නොකළහොත් අප ඔබේ දෙවිවරුන්ට වැඳුම් පිදුම් කරන්නේවත් ඔබ පිහිටුවා ඇති රන් රූපයන්ට නමස්කාර කරන්නේවත් නැති බව ඔබට දන්වනු කැමැත්තෙමි." (3:16-18)

රන් රූපයන්ට නමස්කාර නොකළ ජුදෙව්වරු තිදෙනාව ඇවිලෙන ගිනි උළුනක් මැදට හෙළීම රජුගේ අණ විය. ඒ බව දන්නා ඔවුන් තිදෙනා රජුගේ අණට පිටුපෑමට පවා කිසිදු බියක් නොවීය. ඔවුන්ගේ ඇදහිල්ල මහත් සේ බලවත්ව ශක්තිමත් විය. රජුන් ඉදිරියේ වුවද නිර්භයව කතා කරන්න, එදා බිහි වූ ජුදෙව්වරු තිදෙනා මෙන් එක් මිනිසෙකු හෝ අද බිහිව නැත. එවැනි කවුරුන් හෝ විශ්වාසවන්ත ඇදහිල්ලක් තුළින් බිහි වන්නේ නම් එවැනි ශ්‍රේෂ්ඨ වාතාවරණයක් පවතින්නේ නම් ඒ කොතැනද? යන්න සිතන්න, පුළුවන් කමක් හෝ ඇතිවුවහොත් ඒ පමණින් අප කොයි තරම් සතුටට පත් වේවිද?

### වීරෝදාර ඇදහිල්ල

"ඇදහිල්ල නැති ව උන්වහන්සේගේ ප්‍රසාදය දිනා ගැනීමට පුළුවන්කමක් නැත. මන්ද දෙවියන් වහන්සේ වෙත ළඟා වන්නා උන්වහන්සේ ජීවත් වන බවත් උන්වහන්සේ සොයා එන්න වුන්ට ඉෂ්ට විපාක දෙන කෙනෙකු බවත් විශ්වාස කළ යුතුය." (හෙබ්‍රෙව් 11:6) දෙවියන් වහන්සේ ජීවත් වන බවත්, උන්වහන්සේ ඉෂ්ට විපාක දෙනු ලබන බවත් විශ්වාස කරන්න. එසේ වීමෙන් දේව ප්‍රසාදය දිනා ගැනීම පිණිස ඇදහිලිවන්තයකු වී යාච්ඤාවෙන් දෙවියන් වෙත යැපෙන්නකු වීම ද යෙහෙකි. එවිට සර්වබලධාරී දෙවියන් වහන්සේ අභියස හැර වෙනත් දෙවිවරුන් අභියස බිමට වැටී නමස්කාර කරන්න සිත් පෑදෙන්නේ නැත. සමිඳුන්ට ගරු බිය පාන තරමට උන්වහන්සේගෙන් ගුරුහරුකම් අසන තරමට, ජීවත් වීමට අවශ්‍ය ඉෂ්ට විපාක උන්වහන්සේ විසින් දෙනු ලබන සේක.

✍ **බැසිල් ඇන්ටනි දෙහිපිටිආරච්චි - මොරටුව**

# "යමෙක් ඔබේ වම් කම්මුලට පහර දුන්නොත්...?"



**පීටර් අයියා හාමු මහත්තයාගේ නිල රියදුරුය. නොනිල මුරකරුය. ආදේශක කම්කරුය. කොයි පැත්තෙන් බැලුවත් සුවච කීකරු ගෝලයා ය. එකම එක පරහක් තිබේ. හාමු මහත්තයා මූලග්ගිනි කාරයෙකි. කොතරම් හොඳ කළත් බැනුම් නාහන දවසක් නැත. ඒකට කමක් නැත. කම්මලේ බල්ලාට හෙන ගැහුවත් වෙනසක් නොඇසේ.**

ගමේ අය කියන්නේ පීටර් අයියා හාමු මහත්තයගේ පරණ ණය කාරයෙක් කියලාය. ඒ කෙසේ වෙතත් පීටර් අයියා ද කුකුල් කේන්ති කාරයෙකි. ඒ ගැන දැන ගත හැක්කේ ගමේ කොලු කුරුට්ටන් ගෙනි. ඔවුනට පීටර් අයියා ද පීටර් අයියාට ඔවුන් ද පෙන්නන්ට බැරිය. කොලු නඩයට හාමු ගේ වත්තෙන් ගඩා ගෙඩියක් කුරුම්බාවක් ඩැහැ ගන්නට ඇති එකම මහා ගල්පර බාධකය පීටර් අයියා ය. පීටර් අයියාට සැනසිල්ලේ දවාලට ඇහැ පොඩ්ඩක් පියාගෙන කුකුල් නින්දක් දමන්නට බැරි ලොකුම කං කරච්චලය කොලු නඩයයි. පීටර් අයියාට රාත්‍රි මුරකරු සේවය හුදෙක් නාමික තනතුරක් වී ඇත්තේ හාමු මහත්තයාගේ මිය ගිය පියා හෙවත් ලොකු හාමුගේ අවතාරය ඒ කටයුත්ත බාර ගෙන ඇති හෙයින් මෙලෝ පණ ඇති මිනිහෙක් රෑට නම් වත්තට හොස්ස පොවන්නේ නැති බැවිනි.

ඇත්තම කියනව නම් පීටර් අයියාට ඇත්තේ කොලු කුරුට්ටන්ගේ හිසරදය පමණක් නොවේ. පොල් ගෙඩියක් දෙකක් හොරෙන් ඇහිඳ ගැනීමට මාන බලන්නෝ කොතෙකුත් වෙති. කසිප්පු ඩිංගක් බොන්නට කීයක් හරි හොයා ගැනීම ජීවිත පරමාර්ථය කර ගත් ඩිංගිරා ඉන් එකෙකි. ඔහුගේ කෙරුවාව නිසාම ඩිංගිරි නිසාම ඩිංගිරි බණ්ඩාර, ඩිංගිරි වී අන්තිමේදී ඩිංගිරා විය. අනෙක් කාණ්ඩය නම් තමන්ගේ ගහේ පොල් තිබුණත් නැතත් අන් වස්තුම ආසා කරන "අපේ ගහේ පොල් වලට වැඩියෙන් හාමුගේ වත්තේ පොල් අගෙයි" කියා සිතන ගමේ කාන්තා බලමුළුවය.

පීටර් අයියා දුටු විට ඩිංගිරා කරබාගෙන මාරු වෙයි.

කොල්ලෝ හූ කියා පැන දුවති. එහෙත් ගමේ සමිති සමාගම් සියල්ල නියෝජනය කරන ගුණවතී අසු වුනොත් පොල් ගෙඩිය ආපසු ගැනීම බොරුය. ඇගේ "දීමේ ආදීනව, ස්වර්ගයට යාමේ කෙටිම මඟ, "ලාසරස් ට නොසැලකූ ධනවතාට වූ දේ" ආදී කී නොකී දේශන ගණනාවකට සවන් දී පොල් ගෙඩිය පමණක් නොව හනසු දෙක තුනකුත් දී හිස බේරා ගැනීමට සිදුවෙයි. එහෙයින් පීටර් අයියාගේ රාජකාරිය ලෙහෙසි පහසු එකක් සේ නොසිතිය යුතුය.

ගුණවතී "පරෝපකාර" සමිතියට ගොස් ආපසු යන ගමන් හාමුගේ වත්ත පසු කරන විට වැටට මදක් ඔබ්බෙන් පොල් ගෙඩියක් දැක්කාය. "අපේ වත්තේ පොල් කවදාවත් මේ තරම් ලොකු වන්නේ නැත්තේ මන්දැ"යි ඇය කල්පනා කළාය. එය දුරින් සිට බලා තීරණය කළ නොහැකිය. අතටම ගෙන බැලිය යුතුය. ඉතින් ගුණවතී කම්බියෙන් රිංගා පොල් ගෙඩිය අතට ගත්තේ එම පරීක්ෂණය සිදු කරන්නටය. "ම්..ම්... මේ ගස් වලට හොඳට සාත්තු කරනවානේ" නිගමනය පැහැදිලිය. ඒත් ඉතින් අතට ගත් පොල් ගෙඩිය බිම දමන්නේ ඇයි? හාමුට ඇති පදමට නොව වැඩි පදමට පොල් තිබේ. එකම උරුමක්කාරයාත් ජීවත් වන්නේ පිටරටය. මේ පොල් ගෙඩිය පරිත්‍යාග කිරීමෙන් හාමුට පින් ලැබෙයි. මෙලොව පමණක් නොව එලොවත් පොල් ලැබෙයි. ඉතින් එහෙව් පිනක් කරගන්නට ඉඩ සලසා දීම තම යුතුකමයි. අනෙක මේ පොල් ගෙඩිය දමා ගියත් ඩිංගිරා දැක්කොත් ගන්නවාමයි. ඒකෙන් උෟ කසිප්පු බීවාට ඒ පාපයත් තමන්ටයි. සියලූ කාරණා සලකා බලා පොල් ගෙඩිය ගෙන යාමට ගුණවතී තීරණය කළාය.

ආපසු හැරුණා පමණී, පීටර් අයියා කඩාගෙන පාත්විය. ඉතින් මේ සියල්ල පැහැදිලි කිරීමට ගුණවතීට සිදුවිය. අන්තිමේදී "ඇඳුම් දෙකක් ඇති තැනැත්තා එකක් නැති තැනැත්තාට දෙන්න" යැයි කියූ ජේසුගේ වචන ද පීටර් අයියාට මතක් කර දීමට ඇයට පැය බාගයක්ම ගත විය.

☛ ලබන සතියට

✍ **ඇලෙක්ස් පී.ඩී. ශ්‍රී චන්ද්‍ර**

## සෙනෙහසක අරුම

සොඳුරු මංගල දින
උණු කඳුළු කැට අතරින්
පුදසුන මත පුද කළ
නුඹේ ලොවම මමයි....!

බඩ ගා ඇවිදින්ට අත දී
දෙවි සේවෙට සවියක් වී
ආදරෙන් මා නහවන
මගේ ලොවම නුඹයි...!

**ගරු මහින්දි රාමනායක**
**පැවිදි සොයුරිය**
**"ගොළු බිහිරි අය සඳහා වූ දේව සංරක්ෂණයේ දියණියෝ",**
**වයික්කාල**




"නපුරු දේ නොකරන්න, එවිට ඔබට නපුර සිදු නොවන්නේය. අධර්මයෙන් ඉවත් වන්න; එවිට එය ඔබෙන් ඉවත්ව යන්නේ ය. යාච්ඤාවෙහිදී ඉවසිලිමත් වන්න, දන්දීම අතපසු නොකරන්න. බොරු නොකියන්නට පරිස්සම් වන්න. එයින් කිසි යහපතක් සිදු නොවන්නේය."

**(ශු. බයිබලයේ උපදේශකයාගේ පොතෙනි)**

# ලෝකයේ ආලෝකයාණෝ

**පසුගිය සතිය හා සබැඳේ...**

**ක්‍රිස්තුන් වහන්සේ වදාළ පරිදි පෙන්තකොස්ත දිනදී ලොවට ප්‍රකාශ වූ ආත්මයාණෝ කතෝලික සභාවේ නව පෙරළියකට මඟ හෙළිකළ සේක. "ශුද්ධාත්මයාණෝ ඔබ කෙරෙහි පැමිණි කල ඔබ බලය ලබන්නාහුය. එවිට ජෙරුසලමෙහිද, මුළු ජුදයෙහි හා සමාරියෙහි ද, පොළොවේ සීමාන්තයන් දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නාහුය" (ක්‍රියා1:8) යි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක.**

ශුද්ධාත්මයාණන් වනාහී ජේසු සමිඳුන් පොරොන්දු වූ සැනසිලිදායකයාණෝ ය. අපගේ ශක්තිය, බලය, මේ ජීවිතය තුළ අප මුහුණ දෙන බාධක අවහිරතා, දුක් කම්කටොළු වේදනා වලට ශක්තිමත්ව මුහුණ දීමට ශුද්ධාත්ම ආලෝකය අපට අත්‍යවශ්‍ය වේ. එසේම කිතුනු සහෝදරත්වය තුළ සාමූහික සහජීවනය සඳහා එකම ක්‍රිස්තු ශරීරයක සබඳතාව සාර්ථක කරගැනීමට ද මේ ශුද්ධාත්ම දීමනා අවශ්‍යමය. තවද සමාජ සාධාරණත්වය, යුක්තිය ඉටු කිරීමට, දූෂණය, අසාධාරණය, සූරාකෑම, අල්ලස වැනි සමාජ පිළිලයන් ඉදිරියේ නොබියව කිතුනුවකු ලෙස ක්‍රියාත්මක වීමට ද ශුද්ධාත්ම බල ශක්තිය අත්‍යවශ්‍ය වෙයි.

ශුද්ධාත්ම දීමනා හේතුකොටගෙන අප විශ්වාසයෙන් බලාපොරොත්තුවෙන් හා ප්‍රේමයෙන් එකම සිතක් බවට පත්වේ. අපගේ සැනසිලිදායකයාණන් වූ ශුද්ධාත්මයාණෝ දුක් වේදනාවලින් අගහිඟකමින් පීඩිතව සිටින අසරණයන්ට එකම අස්වැසිල්ල වෙයි. පාපයෙන් මුලා වී අන්ධකාරයේ ගිලී සිටින්නවුන්ට ගැලවීමේ ආලෝකය උන්වහන්සේය. ඇල්මැරුණු කිතුනු ජීවිත ගතකරන්නන් තුළ ප්‍රේමයේ ගින්න දැල්වීමටත්, අදේව දෘෂ්ටිකයන් ද, දෙවිඳුන් ප්‍රතික්ෂේප කරන්නන් ද, ඔබවහන්සේගේ විශ්වාසයේ ආලෝකය වෙතට ගෙන්වා ගන්නා ලෙසටත් අපි ලෝකයේ ආලෝකයාණන්ට අයැද සිටිමු. - නිමි -

✍ **පර්මිලා මධුෂානි පතිරණ**
**අතුරුගිරිය**

මට



න්
තුමා

යේ
මනේ
යයි.

ට

# සැබෑ සතුරා පාපයය

පාපයෙන් ඈත්වෙන පුද්ගලයාට දෙවියන් ලං වෙනවා නියතයි. දෙවියන් අප ළඟ නම් අප කිසිවෙකු හට බිය විය යුතු නැහැ. පාපයෙන් මනුෂ්‍යත්වය පිරිහෙනවා. මනුෂ්‍යත්වය විනාශ කරනවා සැබෑ මිනිසා පාපයෙන් ඈත්වෙන පුද්ගලයා ය.

ජේසු සමිඳුන් තමා මේ ලෝකයේ සිටි ලොකුම මනුෂ්‍යයා. එතුමා පාපයට මිස පවුකරුවාට ගල් ගැසුවේ නැහැ. අප නොදැනුවත්වත් අපෙන් පවු සිදුවෙනවා. දවසේ විසි හතර පැය අප ගත කළ පිළිවෙල මෙනෙහි කරන්න. විහිළුවකට හෝ කෙනෙකුට බොරුවක් කී නම් එය ද එක්තරා පාපයක් වෙනවා. අපි නිකමට කියමු. "තව කෙනෙකු හට, "මා දුටුවා ඉබ්බෙක් ඉගිලෙනවා" කියා ඒ අසන අයගේ මනස මොහොතකට හෝ වෙනස් වෙනවා. එයද අප කරගත් පාපයක් වෙනවා. කටමැද දෙඩීමත් පාපයක් වෙනවා. "තමන්ගේ කට ප්‍රවේශම් කරගෙන හැකිනම් ආත්මය හා ශරීරය පිටින් ස්වර්ගයට යා හැකි" බව ශාන්ත ජාකොබ්තුමා උගන්වනවා. "වචන සියයක් සිතා එකක් පවසන්න" යයි බුදු රජාණෝ ද දෙසා තිබෙනවා.

එහෙත් සැබෑ මනස්ථාපනයක් වීමෙන් පාපයට සමාවක් ලබාගත හැකියි. සිතේ නිදහසකුත් ඇතිවෙනවා. සා. පේදුරුතුමා "ජේසු සමිඳුන් නාඳුනමි" කී බොරුව නිසා එතුමන්ගේ මුළු ජීවිත කාලයම ඇඬූ කඳුලින් ජීවත්වුනු බව කියැවෙනවා. කඳුළු පෙරීම හේතුවෙන් එතුමන්ගේ ඇස් දෙකෙන් පහළ කම්මුල් දෙපසෙහි වළවල් දෙකක් මෙන් සෑදී තිබූ බවත් කියැවෙනවා. අප කරන කොයියම් පාපයකට හෝ සමාවක් දීමට දෙවියන් සූදානමින් සිටිනවා. දඬුවම් ලැබීමටත් අප සූදානම්ව සිටිය යුතුයි. අවුරුදු හතලිහක් තිස්සේ මෝසෙස් තුමා ඊශ්‍රායෙල්වරුන් සමඟ දුක්වින්දා. ඒ කිසිවක් බලාපොරොත්තුවෙන් නොවේ. අවසානයේ පොරොන්දු දේශයට හෝ යා නොහැකිව අතරමඟදී මියැදුනා. ඒ ද එක්තරා පාපයක් විය හැකිය.

ජුසේ තුමාත් එහෙමමයි. ජීවිත කාලයම ඇඬූ කඳුලින් ජීවත් වුනු මරියතුමියද දෙවියන් වහන්සේට වචනයකින්වත් අවලාද කළේ නැහැ. පවු කිරීම නිසා සිතේ නිදහස නැතිවෙනවා. පවුකරුවාට සැනසිල්ලේ නිදාගන්නට හෝ බැහැ. නින්ද යන්නේ නැහැ. අජාසත්ත රජතුමා අවුරුදු දහයක්ම නිදාගත්තේ නැහැ. රාත්‍රියට නින්දෙන් අවදි වෙනවා. පියා මැරූ පාපයට පළිය ගැනීමට පුත්‍රභද්‍ර නම් තම පුත්‍රයා කඩුව අමෝරා ගෙන තමා ළඟට එනු හීනෙන් පෙනෙනවා. එවිට අවදි වෙනවා. අවුරුදු දහයක්ම ගතකළේ එහෙමයි.

☛ 15 පිටුවට


✍ හාල්දඬුවන
**ජේ. විල්ප්‍රඩ් සමරසිංහ**

# ලෞකික සුබ විහරණයෙන් මිදී සදාතනික දෙවිඳුන් සොයා යමු




## සාමාන්‍ය සමයේ 25 වන ඉරුදින

අද සාමාන්‍ය සමයේ විසිපස්වන ඉරුදින වන අතර ශු. සභා මාතාව අප ජීවිත වල ඉතා වැදගත් තීරණයක් ගැනීමට අපට ආරාධනා කරයි. එනම් ලෞකික සුබ විහරණය ලබා දෙන මිල මුදල්, වස්තුව අප ජීවිතවල දෙවියන් කර නොගනිමින් සදාතනික ආත්ම සුවය දෙන දෙවියන් වහන්සේ තුළ ගත කරන ජීවිත ගෙවන්නයි.



අද දින සුවිශේෂය වංචනික ගබඩාකාරයා පිළිබඳ උපමාව අප වෙත ඉදිරිපත් කරයි. එම උපමාව තුළ වංචනික ගබඩාකාරයා සිය ස්වාමියාගේ ධනය අනිසි ලෙස පරිහරණය කිරීම නිසා සිය තනතුර අහිමි වීමේ අභාග්‍යසම්පන්න තත්ත්වයට මුහුණ දෙයි.

එම අවාසනාවන්ත තත්ත්වයන්ගෙන් මිදීමටත්, මුහුණ දෙන්නට සිදුවන සමාජ නින්දාවෙන් මිදීමටත් ඔහු සැලැස්මක් ක්‍රියාවට නංවන්නේ ය. ඔහු මෙම සැලැස්ම ක්‍රියාවට නංවන්නේ අනාගතයේදී සිය ජීවිතය වඩා යහපත් කර ගැනීම සඳහා ය. සිය දක්ෂතාවන් උපරිම ලෙස යොදා ගනිමින් ඉතා සූක්ෂ්ම ලෙස ඔහු මෙම අභියෝගයට මුහුණ දුන්නේ ය.

තමන්ට හිමිවිය යුතු ආදායම අඩු වූවත්, ඒ සඳහා වංචනික ගබඩාකාරයාට දඬුවම් නොකර ඔහුගේ ස්වාමියා ඔහු ශූර ලෙස කටයුතු කිරීම පිළිබඳ ඔහුට ස්තුති කරන්නේ ය.

මෙම උපමාව තුළ ගබඩාකාරයා සිය සමාජ තත්ත්වය රැකගන්නට කටයුතු කළේය. ඉතා නුවණක්කාර ලෙස කටයුතු කරමින් සිය ජීවිතය හා සමාජ තත්ත්වය රැකගන්නට ඔහු ක්‍රියා කළා සේ කිතුනුවන් ලෙස අප ආත්මික ජීවිතය රැක ගැනීමට ජේසුස් වහන්සේ අපට ආරාධනා කරයි. තවද අප ජීවිත දෙස බුද්ධිමත්ව සිතා බලා නුවණින් කටයුතු කර අපට උරුම වන්නට යන සැබෑ වස්තුන් පිළිබඳ සැළකිලිමත් වන්නට ද ඔවුන් වහන්සේ අපට මතක් කරයි.

මෙම ලෞකික ලෝකය තුළ ජීවත් වන අපි සැම අප ජීවිත වලට එල්ල වන බාධා, අමාරුකම්, තර්ජන වලට නිසියාකාරව මුහුණ දෙන්නටත් ඒවායින් නිදහස් වී ජීවිත ගත කිරීමටත් හැකි සෑම උත්සාහයක්ම දරමු. අප භෞතික ජීවිතය මූලිකත්වයේ ලා සලකමු. එහෙත් අපි සැම ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ මෙම ලෝකයට පමණක් අයිති වූවන් නොවෙමු. අපි ක්‍රිස්තුන් වහන්සේ අනුග මනය කරමින් ආලෝකයේ දරුවන් ලෙස ජීවත් වන්නට ආරාධනා ලද්දෝ වෙමු. එලෙසම දේව ආදරය අත්දකින දෙවිපියාණන් හා සම්බන්ධ පිරිසක් ද වන්නෙමු. එහෙත් අපගේ මෙම කැඳවීම අභියෝගයට ලක්වන වාර ගණන අනන්තය. අවාසනාවට කරුණ නම්, බොහෝ අවස්ථාවන් වලදී අපි ඒ පිළිබඳ නොසලකා ලෞකික ජීවිතය ගැන පමණක් සිතා කටයුතු කිරීමය. එවැනි අප ආත්මික ජීවිතය අභියෝගයට ලක්වන අවස්ථාවක් හා අරගල කරන්නට, ඒවායින් ජය ගන්නට අපි උත්සාහ කරන අවස්ථා ඉතාමත් අල්පය.

අප ලෞකික සැප සම්පත් ලබා ගන්නට කෙතරම් නුවණක්කාර ලෙස කටයුතු කළත් ඒ හා සමානව ආත්මික ජීවිතය සැපවත් කරගන්නට කටයුතු නොකරමු.

එම නිසා ක්‍රිස්තුන් වහන්සේ අපට ආරාධනා කරන්නේ, මේ ලෝකයේ පුත්‍රයන් ලෞකික දේ ගැන ඉතා සූක්‍ෂම ලෙස ක්‍රියා කරන්නා සේ ආලෝකයේ පුත්‍රයන් ලෙස අප ආත්මික සුබ සිද්ධිය සඳහා ඉතා නුවණක්කාර ලෙස ක්‍රියා කරන්නටය.

✍ ජාතික දෙව්සත්හලේ
ගොන්සාල්වෙස් සිංහල ආයතනයේ
**ගරු චාමික සුදර්ශන**
**නි.ම.නි. සහෝදරතුමා**

**ගරු හෙන්රි සිල්වා පියතුමා**

# "එළිදරව්ව"ට හැඳින්වීමක්




**පසුගිය සතිය හා සබැඳේ**

ක්‍රිස්තුන් වහන්සේ සංකේතවත් කරන බැටළුවා යන වචනය එළිදරව්වේ "අර්නියොන්" යන්නෙන් පමණක් දක්නට ඇති අතර ජුවාම් සුවිශේෂයේ "අම්නොස් යන්නෙන් හඳුන්වා ඇත. ඉහත කී ග්‍රන්ථයන්ගේ ශෛලය හා දේව ධර්ම ආකල්ප සසඳා බලන කල ඒවා අතර සැළකිය යුතු වෙනස්කම්ද ඇති බව පැහැදිලි වේ. ආරූඪ නාමයක් යටතේ ග්‍රන්ථයක් ඉදිරිපත් කිරීම එළිදරව් සාහිත්‍යයේ විශේෂාංගයක් නිසා එළිදරව්ව ජුවාම් අපෝස්තුළුතුමන්ගේ නාමයට ආරූඪ කර ලියා ඇතැයි සිතීම යුක්ති සහගතය.

**ග්‍රන්ථයේ සැලැස්ම**

එළිදරව්ව සංදේශයක ආකාරයෙන් ඉදිරිපත් කර ඇත. පාවුළු තුමාගේ සංදේශයන් මෙන් මෙය ද ආරම්භ වන්නේ ආචාරයකිනි. (එළිදරව් 1:4-5) අවසන් වන්නේද එසේය. "ජේසුස් ස්වාමින් වහන්සේගේ කරුණාව සියල්ලන් සමඟ වේවා" (එළිදරව්ව 22:21) මේ ග්‍රන්ථය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකිය. එනම් ආසියාවේ සභා සතට ලියන ලද සංදේශ සත (එළිදරව්ව 2:1-3,22) හා එළිදරව්වාදී කොටස (එළිදරව්ව 4:1-22,17) යන වශයෙනි. සංදේශයන් අඩංගු කොටස ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ඒ ඒ සභාවන්ට ආමන්ත්‍රණය කරන අයුරින් ඉදිරිපත් කර ඇත. එහි ඔවුන් වහන්සේ විසින් තමන් වහන්සේගේ ආධිපත්‍යයට ඉඟියක් කරමින්, සභාවල යහපත් තත්ත්වය ගැන ඒවාට ප්‍රශංසා කර, අඩුපාඩුකම් පිළිබඳව අනතුරු හඟවමින් අවශ්‍ය අවවාද අනුශාසනා දී ඒවා දිරිමත් කරන බවක් දක්නට ලැබේ. එළිදරව්වාදී කොටසේ ප්‍රධාන වශයෙන් නොයෙකුත් සංකීර්ණ සංකේතයන්ගෙන් පිරි දර්ශනයන් ද බොහෝ විට ඒවා පහදා දෙන අයවලුන්ද ඇති බව පැහැදිලි වේ.

සංස්කාරක හැඳින්වීමකින් පසු (එළිදරව්ව 1:1-3) ආචාරයකින් ආරම්භ වන මෙම ග්‍රන්ථයෙහි ඉතා චමත්කාර වුවද එහෙත් පහසුවෙන් වටහා ගැනීමට අසීරු ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ මූලික දර්ශනයක් (එළිදරව්ව 1:9-20) ඇත. මෙම දර්ශනයට නිතර ඉඟියක්, සභා සතට ලියන ලද සංදේශවල දක්නට ලැබේ. සුළු වශයෙන්වත් මෙම ග්‍රන්ථයේ පණිවුඩය පමණක් නොව එක වචනයකුදු පවා වෙනස් කිරීමට තැත් කරන්නන් හට ශාපයක් එල්ල කරමින් ග්‍රන්ථය අවසන් වෙයි. (එළිදරව්ව 22:18-19) එසේ කර ඇත්තේ එහි ඇති අති විශේෂ වටිනාකම හුවා දැක්වීමටය.

## පූජා සතිය
## සැප්. 22 - 29 දක්වා

| | |
|---|---|
| 22 ඉරිදා | **සාමාන්‍ය සමයේ විසිපස්වන ඉරුදින**<br>(කොළ) ආමොස් 8:4-7<br>ගීතාවලිය 113:1-2,4-8<br>1 තිමෝති 2 : 1-8<br>ලූක් 16:1-13 හෝ 10-13 |
| 23 සඳුදා | **පියෙට්‍රල්සිනාවේ සා. පියුස් මුනි අනුස්මරණය**<br>(සුදු) එස්රා 1:1-6 ගීතාවලිය 126:1-6<br>ලූක් 8:16-18 |
| 24 අඟහරුවාදා | (කොළ) එස්රා 6:7-8,14-20<br>ගීතාවලිය 122:1-5 ලූක් 8:19-21 |
| 25 බදාදා | (කොළ) එස්රා 9:5-9<br>(සංගීතය) තෝබිත් 13:2-4,6-8<br>ලූක් 9:1-6 |
| 26 බ්‍රහස්පතින්දා | **ප්‍රාණපරිත්‍යාගී සා. කොස්මස් හා දමියානු මුනි අනුස්මරණය**<br>(කොළ/රතු) හග්ගයි 1:1-8<br>ගීතාවලිය 149:1-6,9 ලූක් 9:7-9 |
| 27 සිකුරාදා | **ශුද්ධවූ වින්සෙන්ති ද පාවුළු මුනි අනුස්මරණය**<br>(සුදු) හග්ගයි 1:15-2:9<br>ගීතාවලිය 43:1-4 ලූක් 9:18-22 |
| 28 සෙනසුරාදා | **ප්‍රාණපරිත්‍යාගී සා. වෙන්සස් ලාවුස් මුනි අනුස්මරණය**<br>**සා. ලෝරන්ස් රුවිස් සහ සහචර මුනිවරු**<br>(කොළ/ රතු) සෙකරියා 2:1-5,10-11<br>(සංගීතය) ජෙරමියා 31:10-13<br>ලූක් 9:43-45 |
| 29 ඉරිදා | **සාමාන්‍ය සමයේ විසිහයවන ඉරුදින**<br>**(ජාතික ධර්මෝපදේශ දිනය)**<br>(කොළ) ආමොස් 6:1,4-7<br>ගීතාවලිය 146:5බී - 10<br>1 තිමෝති 6:11-16 ලූක් 16:19-31 |

# විපුල ආසිරි උපන් දිනයක්



කැටුව ආත්මය - සිරුර සමඟින්
වැඩියා සුරලොවට - වළාකුළු අතරින්
පළඳා කිරුළ - දෙව් මව් විලසින්
ගත්තා අසුන් - දෙවිඳු අසළින්

සිටියත් දෙව්ලොව - ඇත විමසිල්ලෙන්
වෙයි පිළිසරණ - යැදූ සැණෙකින්
පතමු අපි සැම - මහත් බැතියෙන්
විපුල ආසිරි - දිනයක් උපන් !

✍ රද්දොළුගම
**වසන්ත පී. ඒ. රත්නායක**

# කතෝලික සමාජ ධර්මයේ අයිතිකරුවා කව්ද?

**කතුතුමනි,**

මීට සති කීපයකට පෙර ජාතික පුස්තකාලයේ පැවති පොත් අලෙවියකින් කතෝලික සමාජ ධර්මය පිළිබඳව පොත් කාණ්ඩයක් මිලදී ගතිමි. එහෙත් ඒවා නිසි ලෙස පෙරලා බැලීමට මට අවස්ථාවක් ලැබුණේ දැන් දින කීපයකට පෙරදීයි.

මීට වසර ගණනාවකට පෙර ලබාගත් කතෝලික සමාජ ධර්මය පිළිබඳව ලියැවුණ විශාල ග්‍රන්ථයක්ද මා සතුව ඇත. මට පෙනී ගියේ මෙම නව ග්‍රන්ථ කාණ්ඩය පෙර ග්‍රන්ථයේ නම් ගම් වෙනස් කොට එහිම ලිපි විකෘතිකොට පළකිරීමක් පමණක් බවයි. එතකුදු වුවත් තම ග්‍රන්ථ කාණ්ඩයේ කර්තෘකමත් සංස්කාරක කමත් සිරිල් එඬේරමුල්ල මහතා හිමිකර ගෙන ඇත.

මෙහිදී ප්‍රශ්න සහ ගැටලු රාශියක් පැනනගියි. පාප්වහන්සේගේ නිල පොත්වල කර්තෘකම කාටවත් ගතහැකිද? ඒවා කාටවත් සංස්කරණය කළ හැකිද? ඒ පළමු ගැටලුවයි. අනතුරුව තවත් ප්‍රශ්න රාශියක් පැන නගියි.

එකම නිල ග්‍රන්ථයක් කොටස් රාශියකට කඩා පරිච්ඡේද හැටියට දක්වා ඇති අතර, පරිච්ඡේද පූර්ණ නිල ග්‍රන්ථ හැටියට දක්වා ඇත. සමහර ග්‍රන්ථවල නම් ද මුල් ග්‍රන්ථයේ නම් වෙනස් කර ඇත.

එසේ නම් වෙනස් කිරීමට කාටවත් බලයක් තිබේද? ඊළඟ ගැටලුව සහා නිල ග්‍රන්ථ හැම එකක්ම පාහේ ඡේදයෙන් ඡේදය වෙන් කිරීමට අංකයක් යොදා ඇති සැටි දැක ඇත්තෙමි. එහෙත් මෙම නව ග්‍රන්ථකාණ්ඩයේ අංක ඉවත්කර ඇති අතර, කොටසක් උපුටා ගත් කල සඳහන් කරන්නට වෙන්නේ කර්තෘ සිරිල් එඬේරමුල්ල වශයෙනි. සභාවේ නිල ග්‍රන්ථවල හිමිකරුවා එලෙස ඔහු වෙයි.

මෙලෙස කතෝලික සමාජ ධර්මය විකෘති කිරීමක් දක්නට ඇත. මෙය භයානක තත්ත්වයකි. මෙය භාවිත කරන්නන් ද නොදැන නොමග යනු ඇත.

එහෙයින් මෙම තත්ත්වය ගැන සභා පාලකයන්ගේ අවධානය යොමුවීම අවශ්‍ය දෙයකි.

**අමිල ජයතිලක**
කඳාන

# සලාපුර අතිඋතුම් ප්‍රෑන්ක් මාකස් හිමි මතකයෙන්

**කතුතුමනි,**

ඈත මහසයුරේ රළගෙඩි බිඳෙමින් නැගෙන හෝ හෝ හඬ මුසුව කලපුවෙන් හැමූ සීතල සුළඟ සමගින් දිව්‍ය පූජා යාගයේදී ඔබවහන්සේ ගැයූ ඒ "ස්වර්ග යෙහි දෙවියන් වහන්සේට මහිමය වේවා! යන්න අදත් සුරදූත සමූහය සමග ඔබවහන්සේ ස්වර්ගයේ මහත් හඬින් ගයන බව අපි විශ්වාස කරමු. අවුරුදු හැට අටකට ආසන්න ඔබගේ පූජක දිවිය අති පවිත්‍රය. යහපත් එඬේරාණන් ලෙස තිස් හතර අවුරුද්දක් අපට මෙහෙවර කළේ කුඩා දරුවකු සේය. එහෙත් ඔබගේ සිනහව තුළ ගැබ්වූ අවංක බව, නිරහංකාර බව, වියත් බව කිව යුතුමය. පැසසිය යුතුමය.

රදගුරු පදවියෙන් ඉසිඹු ලැබූ මොහොත මට තවමත් මතකය. ඔබවහන්සේගේ පහස ලැබූ සලාපුරය සහ දේව ජනතාව අතහැර යන්නට නොහැකිව නිහඬව බලා සිටි අයුරු මට තවමත් මතකය. රදගුරු මැඳුරේ දැවයෙන් තැනුනු සෝපානය (පඩිපෙළ) අසලදී මගේ ආත්මික පියාණන්ද, කල්‍යාණ මිත්‍රයකුද වූ ඔබවහන්සේගෙන් සමුගන්නට ආවෙමි. රක්ත වර්ණව බැබලුනු මුහුණ දෙස මම බලා සිටියෙමි. ඔබවහන්සේ මා දෙස බලා සිටියා මිස කිසිවක් නොදෙඩීය. ඔබවහන්සේගේ දෙපාමුල වැටුනු මා ඔබේ ආශිර්වාදය ලැබ මහත් ආයාසයෙන් නැගිට අඩි දෙක තුනක් පසු පසට ගියෙමි. තවත් මොහොතක් බලාසිටියෙමි. ඔබවහන්සේ හෙමි හිට හෙමි හිට සෝපානයේ පඩිපෙල නගිමින් නොපෙනී ගියා මතකය.

විශ්‍රාම ගැනීමෙන් පසු ඔබවහන්සේ කුමක් කරන්නේදැයි, මම එක් දිනක් ඇසුවෙමි. එදා ඔබවහන්සේගේ පිළිතුර වූයේ භාවනාවට යාච්ඤාවට මුල් තැන දීමත් පොත් ලිවීමත් කරන බවය. මාස කීපයකට පසුව සලාපුර රදගුරු නිවසින් පිටව දුම්මලසූරිය ගල්මුරුව වත්තේ විවේකී නිවහනට පැමිණි ඔබවහන්සේ නොසැලුනු පර්වතයකි.

ධීවරයාට, දුගියාට, පරිසරයට ඉතාමත් ආදරය කළ බවට එක් නිදසුනක් පමණක් දක්වමි. ඉරණවිල ඇමෙරිකන් හඬ, නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ප්‍රධානය. එයින් සිදුවන පරිසර දූෂණය සහ මිනිසාට සිදුවන විපත් රජයට ඉදිරිපත් කළද එම කරුණු රජය ප්‍රතික්ෂේප කළේය. අදද එය ගොඩගනු නොහැකිව රජයේ නිළධාරින් මහත් අසීරු තත්ත්වයකට පත්ව ඇත. සලාපුර කාර්මෙල් දෙව්මැඳුරට මෙන්ම එයටත් වඩා තලවිල සා. ආනා දෙව්මැඳුරටද අවට පරිසරයටද ඇඩි ආදරයකින් ගෞරවයක් දැක්වූ අතර අතිවිශාල සංවර්ධන කටයුතුද ඒ අතර විය.

**බී. පාවුලු ප්‍රනාන්දු**
කෙත්හේන

# අඩුපාඩු වලින් සපිරුන ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව

**කතුතුමනි,**

ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව 2013 වර්ෂයේ මුද්‍රණය කළ දිනපොතේ තත් සම්බන්ධීකරණ ලේකම නාමය මුද්‍රණය කර නොමැත. එය 2014 නියමිත දිනපොතේවත් මුද්‍රණය කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

එම දිනපොතේ කතෝලික රදගුරු සමුලු නාමාවලිය මෙන්ම ප්‍රධාන වන්දනා ස්ථාන පිළිබඳ කෙටි සඳහනක් කරන්නේ නම් වඩාත් යෝග්‍ය වන්නේය. භාග්‍යවත් ජුසේවාස් පියතුමන්ගේ ඡායා රූපයක් ඇතුළත් වන්නේනම් එය කාලෝචිත වන්නේය. අද්භූතරමීන් මීසමක ප්‍රධාන දෙව්මැඳුරේ දුරකතන අංකයවත් යෙදීම රාජකාරි කටයුතු වලටද පහසුවක් වන්නේය. ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුවට සම්බන්ධ දෙව්මැඳුරු වලින් 95% ක්ම කතෝලික අංශයට අයත් හෙයින් මේ පිළිබඳව අවධානය යොමු කිරීම යුක්ති සහගත වන්නේය.

**තියබෝල්ඩ් සමරතුංග**
රත්නපුර

# මීගමුවේ දොන් බොස්කෝ පිළිරුවටත් වහලයක්!

**කතුතුමනි,**

මීගමුවේ පෙරියමුල්ල දුම්රිය හරස්පාර අසල දොන් බොස්කෝ ප්‍රතිමාවක් පිහිටුවා දැනටමත් කලක් ගතව ඇත. ඉතාමත් දර්ශණීය අන්දමින් එහි නිමාව සිදුවී ඇති අතර ස්ථානගත කළ අවට කදිම පරිසරයක් බිහිකර තිබේ.

සියල්ල යහපත්ව පැවතියත් ප්‍රතිමාවේ කල්පැවැත්ම, අව්ව වැස්ස හා පක්ෂීන්ගේ අපවිත්‍ර කිරීම් වලින් මුදවා ගැනීම අත්‍යවශ්‍යව පවතී. පාරේ ගමන් බිමින් යන්නන්ගේ තිබඳ ගරු බුහුමනට හා ගෞරව සමාචාරයට මෙය පාත්‍රව තිබීම කතෝලිකයන් වශයෙන් කාහටත් ආඩම්බරයකි. වෙනත් ආගමිකයන්ගේ ග්‍රහණයට මේ ස්ථානය ගොදුරුවීමට ප්‍රථම පුංචි රෝමයේ අනන්‍යතාවය රැක ගැනීමට හැකිවීම අගේ කළයුතුය.

මීගමු නගර සහා භූමියේ පිහිටි ජේසු ප්‍රතිමාවද මහත්සේ විරාජමානව පුංචි රෝමයට පිවිසුම් මාර්ගයේ අංග සම්පූර්ණව තේජසින් වැඩ හිදී. කතෝලික බහුතරයක් වසන මීගමුව අන්‍යාගමික කෙනහිලිකම් හා යටිකුට්ටු ව්‍යාපාර වලින් මුදවා ගැනීමට මේ සුවිසල් ප්‍රතිමාවන් නොමඳ සේවයක යෙදී ඇත. එවන් වාතාවරණයක් පවතින අවධියක මෙකී ශුද්ධවූ ප්‍රතිමාවන් රැකබලා ආරක්ෂා කර ගැනීම අපේ පරම යුතුකමක් වනු ඇත. එබැවින් දොන් බොස්කෝ ප්‍රතිමාව පිහිටෙවූ සංගමයට හෝ වෙනත් පිරිසකට, ආයතනයකට ප්‍රතිමාවේ දිගු කල් පැවැත්ම සඳහා නගර සහා භූමියේ ජේසු ප්‍රතිමාවට මෙන්ම ආරක්ෂිත 'වහලයක්' සවිකර දෙන මෙන් හද බැතියෙන් ආයාචනා කර සිටිමු.

**කේ. ඒ. රෝලන්ඩ් ලෙස්ලි**
දළුපත

# නමෝ මරිය යැදුමට සංශෝධනයක්!

**කතුතුමනි,**

මරිය වසර ඇරඹීමට තවත් ඇත්තේ කෙටි කාලයකි. මරිය තුමිය අපට තිබෙන අසීමිත ආදරය නිසා සුරලොව සිට මෙලොවට පැමිණ ලෝ වාසී දරුවන් ඇමතූ සෑම අවස්ථාවකදීම 'ශුද්ධවූ ජපමාලය' උච්චාරණය කරන මෙන් ලෝ වැසියන් ගෙන් ඉල්ලා ඇත.

එම ඉල්ලීම නිසා නමෝ මරිය යැදුමට එතුමියගෙන් තිබෙන්නාවූ ඇඩි ආශාව හා කැමැත්ත එයින් අනාවරණය වේ.

මරිය වසර ආරම්භ කරන පළමු දිනයේ සිට "නමෝ මරිය යැදුම උච්චාරණය කරන සෑම අවස්ථාවකදීම "ස්වාමි ඔබ තුමිය කෙරෙහිද" කියාද, ඔබතුමියගේ සිරි කුසෙහි ඵලවන් ජේසුස් කියාද, වෙනස් කර නමෝ මරිය යැදුම උච්චාරණය කිරීම සුදුසු බව මගේ අදහසයි.

මේ පිළිබඳව කතෝලික ජනවන්දනා කොමිසම නිසි පියවර ගන්නේ නම් කෘතඥවෙමි.

**සි. සෙ. ප්‍රනාන්දු**
උඩුගම්පල

# කාදිනල් හිමිපාණන්ගේ නිවේදනය අගය කරමු

**කතුතුමනි,**

අගෝස්තු 26 වන දින ප්‍රදීපයේ 'ජනතා හඬ' පිටුවේ පළවූ 'සෙන්ට් ඇන්තනීස් නයිට්, සෙබස්තයින් නයිට්, සාන්ත ආනා මේලා' යන නම්වලින් සමහර දේවස්ථානවල මංගල්‍යය නිමිත්තෙන් පවත්වනු ලබන සංගීත සංදර්ශන මගින් කතෝලික සභාව මහත් ගෞරවාදරයෙන් සමරන සාන්තුවරයන් අගෞරවයට පත්වන බැවින්, එම සංගීත සංදර්ශන ආදියට සාන්තුවරයන්ගේ නම් යෙදීමෙන් වළකින ලෙස, උතුරු කොළඹ කලාපීය නාහිමි අතිගරු ජේ. පැට්රික් පෙරේරා පියතුමා කළ ඉල්ලීම පිළිබඳව අවධානය යොමුකළ, කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ 2012.08.28 දාතමින් නිකුත් කර ඇති නිවේදනය ගැන ප්‍රදීප පාඨක හැමදෙනාගේම ස්තුතිය මෙසේ පළකර සිටිමු. තවද, ප්‍රදීපයේ ජනතා හඬ මෙතරම් ඉක්මණින් ඵලදැරීම ගැනද අපගේ සතුට ප්‍රකාශ කරමු.

**ප්‍රදීප පාඨකයෙක්**

# කතෝලික සාමදාන මණ්ඩලයක් මීසම් මට්ටමින්

**කතුතුමනි,**

අප පවුලේ දරුවන්ගේ ඉගෙනීමේ කටයුතු සඳහා අන්තර්ජාලයේ ඉංග්‍රීසි පාඩම්වලින් වචන මාලාවක් ලබා ගැනීමට දින කීපයකට පෙර මම උත්සාහ කළෙමි. අන්තර්ජාලයේ එක් නාලිකාවක් ඔස්සේ එම වෙබ් අඩවියේ උප ශීර්ෂයක් පරීක්ෂා කිරීමට උත්සාහ කළ වහාම පුදුම සහගත ලෙස බෙහෙවින් අසභ්‍ය දසුනක් දිස්විය. එය තවදුරටත් ඉදිරියට යන්නක් විය. හොඳ වෙලාවට දරුවන් කිසිවකු එහි නොසිටියත් බලාපොරොත්තු නොවූ මෙය ප්‍රහේලිකාවකි.

පසුදින වෙනත් පරිගණකයකින් නැවත උත්සාහ කළ විට එලෙසම තිරයේ දිස්විය. මා වහාම දුරකථන අංකය සොයාගෙන ඇමතුම් කීපයක් ගෙන විදුලි සංදේශ නියාමන කොමිසම වෙත මේ බව ඇනුම් දුන් විට එම නිලධාරින් කීවේ මෙය සර්ට් (CERT) නමැති ආයතනය වෙත පැමිණිලි කළයුතු බවය. ඒ අනුව එම ස්ථානයේ නිලධාරි මහතකුට මෙම විස්තර සපයා ඔවුන් මේ සම්බන්ධව ගන්නා ලද ක්‍රියා මාර්ගය මා වෙත දැනුම් දෙන ලෙස ඉල්ලා මගේ දුරකථන අංක ඔවුනට ලබාදුනිමි. පැය කීපයක් ගතවීත් ඔවුන් පිළිතුරක් නොදුන් බැවින් මා නැවත කථා කළ විට කීවේ එවැන්නක් ඔවුනට සොයාගත නොහැකි බවය. එහෙත් මා නැවත අන්තර්ජාල වෙනත් නාලිකා ඔස්සේ ද එලෙසම උත්සාහ කළ විට පෙරටත් වඩා පහසුවෙන් එම නාලිකා ඔස්සේද ඉංග්‍රීසි පාඩම් අතර එම උප සිරස්තල යටතේ එම දසුන් දැකගත හැකිවිය.

මෙය මහත් බරපතල කාරණයකි. ලොකු කුඩා දරුවෝ දැන හෝ නොදැන අලුත් යමක් දැන ගැනීමේ දැක ගැනීමේ ආශාවෙන් අන්තර්ජාලයේ සැරිසරති. මෙය ඇලි පිහියෙන් කිරි කන්නාසේම වඳුරන්ට ඇලි පිහියක් අසුවූවාක් වැනි අවස්ථාවකි. මෙම කරුණ නියාමනය කිරීමට ඇති ආයතන මීට වඩා වගකීමකින් කටයුතු කළයුතුව ඇත. පැමිණිල්ලක් කළ විට විශේෂයෙන් දරුවන්ට ඉතා අනතුරුදායක ලෙස බලපාන මෙවැන්නකදී පැමිණිලිකරු නැවත සම්බන්ධකරගෙන එය තව තවත් සොයා බැලීමට එම වගකිවයුතු ආයතන ක්‍රියා කළ යුතුය. අධ්‍යාපනික වැඩසටහන් අතරට මේවා රිංගවීම දරුවන් අතරට පහසුවෙන් ඒවා ගෙන යාමට දරණ උත්සාහයක් විය හැක.

මෙම කරුණු සම්බන්ධව දෙමාපියන් ඇඩි අවධානයක් සැළකිල්ලක් දැක්වීම අනිවාර්යයෙන් කළයුතුව ඇත.

**බර්නාඩ් පී. දාබරේ**
එඬේරමුල්ල

# දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ජ්වලිතකම වර්ධනය කර ගනිමු!

**කතුතුමනි,**

"දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ මහමඟ වැඩම කර නිගරුවට ලක් කරනු එපා" යනුවෙන් අගෝස්තු 04 දින ප්‍රදීප පුවත් පතේ මීගමුවේ අයිවන් රණසිංහ මහතා විසින් පලකර තිබූ ලිපිය සම්බන්ධවයි.

බහුතර අන්‍යාගමිකයන් වාසය කරන අප ප්‍රදේශයේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩමවා නගර මධ්‍යයේ පෙරහර පවත්වා දේවස්ථාන වල සෑම වසරකම ඉතාමත් ගෞරව භක්තියෙන් උත්සවාකාරයෙන් ආශිර්වාදය පවත්වනු ලැබේ. කතෝලික, බෞද්ධ, මුස්ලිම් විශාල ජන කොටසක් සමගියෙන් වෙසෙන හංවැල්ල මීසමට අයත් ග්‍රාමයන්හි අප ජීවන දායකයාණන්වන ජේසු සමිඳාණන්ගේ ශ්‍රී ශරීරය වන දිව්‍ය සත්ප්‍රසාදය වහන්සේ වෙත අගෞරවයක් සිදු නොවන ආකාරයෙන් එය පවත්වනු ලැබේ.

සැබෑ ක්‍රිස්තු අනුගාමිකයන් වන අප ගස්, ගල් වලට වන්දනා කරන්නන් නොවෙමු. අපට ඇත්තේ සර්වබලධාරී එකම එක දෙවි මහෝත්තමයාණන් වහන්සේ පමණකි. අපේ විශ්වාසය එය නම් කුමකට බිය වෙමුද? විශ්වාසය ඇති කළ යුත්තේ කතෝලිකයන් වන අප තුළමය. දුර්වල අප වෙනුවෙන් ජීවිතය පූජා කළ ජේසු සමිඳුන් වෙත අප කෙලෙසින් ගරු පැසසුම් කළ යුතු වෙමුද? ඒ ආදරය කෙතරම් පූජනීයද? උතුම්ද? "ආදරය යනු ආත්මාර්ථකාමිව ලබාගන්නා දෙයක් නොව කැපකිරීම තුළින් ලබාදිය යුතු උත්තරීතර බැඳීමකි. ජේසු තුමන් අප වෙත දක්වන අසීමිත ආදරය හදවතින් වැළඳ ගනිමු. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට දිය යුතු නිසි ගෞරවය දක්වමු. බැතියෙන් පෙරහර පවත්වා ලොව මවා සියල්ල ජයගත් දෙවි සමිඳුන් පසසමු.

**ග්‍රේස් මාලනි රූපසිංහ**
පහත්ගම